# ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

இலங்கை கடற்றொழில் நீரக வலமூளங்கள் அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FISHERIES & AQUATIC RESOURCES DEVELOPMENT



# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2013

## ලංකා ධීවර සංස්ථාව

## இலங்கை கடற்றொழில் கூட்டுதாபனம்

## Ceylon Fisheries Corporation

# පටුන


| | පිටුව |
|---|---|
| • ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය | 01 |
| • සාංගමික තොරතුරු | 02-03 |
| • දැක්ම හා මෙහෙවර | 04 |
| • ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය | 05 |
| • සභාපතිගේ සමාලෝචනය | 06-07 |
| • අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 08-15 |
| • විගණකාධිපතිගේ වාර්තාව | 16-28 |
| • විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු ලිපිය | 29-37 |
| • මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 38 |
| • විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 39 |
| • මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 40 |
| • ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 41 |
| • ආංශික විස්තීරණ ආදායම හා මධ්‍යම පරිපාලන පොදුකාර්ය පිරිවැය අවශේෂණ ප්‍රකාශය | 42 |
| • ගිණුම් සටහන් | 43-50 |
| • වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය | 51-55 |
| • මූල්‍ය සාරාංශය | 56 |
| • අනුපාත විශ්ලේෂණය | 57 |
| • සේවක විස්තර වාර්තාව | 58 |

**<u>සාංගමික තොරතුරු</u>**

| | | |
|---|---|---|
| සංස්ථාවේ නම | :- | ලංකා ධීවර සංස්ථාව |
| නෛතික ස්වාභාවය | :- | රාජ්‍ය සංස්ථාව |
| සංස්ථාපනය කරන ලද දිනය | :- | **1957** අංක **49** දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ **1964** ඔක්තෝම්බර් මස **1** වන දින |

අධ්‍යක්ෂවරුන් :-

| | | |
|---|---|---|
| එන්.එච්.මහිල්.පී.සේනාරත්න මහතා | - | සභාපති |
| ශාන්ත හේරත් මහතා | - | උප සභාපති |
| සදරුවන් ලංකේශ්වර මහතා | - | කලමනාකාර අධ්‍යක්ෂක |
| දර්ශනා සේනානායක මිය | - | අධ්‍යක්ෂ - මහා භාණ්ඩාගාර නියෝජිත |
| එච්.යසලාල් පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ |
| ඩැනී.ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ |
| එම්.එච්.එම්.ජෙලාල්ඩීන් මහතා | - | අධ්‍යක්ෂ |

***2***

***<u>ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය</u>***

| | | |
|---|---|---|
| පුරප්පාඩු | - | සාමාන්‍යාධිකාරී |
| එම්.පී.සෝමචන්ද්‍ර මහතා | - | ප්‍රධාන කළමනාකාර ( නොවැම්බර් දක්වා) |
| ඩී.එස්.ඩබ්.ඒ.ආර්.පෙරේරා මහතා | - | පරිපාලන කළමනාකාර |
| ජේ.එම්.ඒ.යූ.ඩබ්.බී.ජයසුන්දර මහතා | - | මූදල් කළමනාකාර |
| ටී.ඩී.ප්‍රියන්ත මහතා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| කේ.වී.එච්.බණ්ඩාරනායක මහත්මිය | - | නීති නිලධාරිනී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |
| පී.කේ.අනුරාධ මනරංජන මහතා | - | මෙහෙයුම් කළමනාකාර |
| ඊ.ඒ.එස්.එදිරිසිංහ මහතා | - | වැ/බ සේවක මණ්ඩල කළමනාකාර (තාවකාලික) |
| ඒ.ජී. ද සිල්වා මහතා | - | වැ/බ ප්‍රධාන ඉංජිනේරු |
| කේ.ජේ. ආර්.එස්.ප්‍රනාන්දු මහතා | - | අලෙවි කළමනාකාර (කොන්ත්‍රාත්) |
| අයි.එස්.හෙට්ටිගේවා මහත්මිය | - | සිවිල් ඉංජිනේරු |

ලියාපදිංචි කාර්යාලය :- නො. 15, රොක්හවුස් පටුමග, කොළඹ -15.
විගණකවරුන් :- විගණකාධිපති
බැංකු කරුවන් :- ලංකා බැංකුව
මහජන බැංකුව

## දැක්ම

**ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම.**

## මෙහෙවර

- **ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබාදීම.**

- **මසුන් නිෂ්පාදනය , සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම.**

- **ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබාගැනීම**

- **නවීන තාක්ෂණය යොදාගනිමින් සාධාරණ මිලකට උසස් තත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරතවීම**

## ගරු ධීවර හා සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය

අංක. 15, රොක් හවුස් පටුමග,
මෝදර, කොළඹ 15,
2016 ඔක්තෝබර් 24

ගරු මහින්ද අමරවීර මැතිතුමා,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ - 10.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය සහ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව
2. 2013 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
3. 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
4. 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව
5. විගණකාධිපති වාර්තාව සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් සපයන ලද පිළිතුර

මෙම වාර්තාව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී වූ,

ජගත් කුමාර පෙරේරා
සභාපති
ලංකා ධීවර සංස්ථාව

## සභාපතිගේ සමාලෝචනය

ශ්‍රී ලාංකීය මසුන් අලෙවියේ නිරත එකම රාජ්‍ය ආයතනය වන ලංකා ධීවර සංස්ථාවේ මූලික වගකීම ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට දායකවීම සහ පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලට මසුන් ලබාගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම වේ. මෙහිදී සමාජයේ සෑම ජනකොටසකම සිය ආදායම් මට්ටම අනුව මසුන් මිලදීගැනීමේ පහසුකම් සලසාදීම හා ඒ තුලින් ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීමෙන් හා ඔවුන්ගේ ජීවන වියදම් පහත දැමීමට සෘජුවම දායකවීම යනාදී ඉලක්ක සපුරා ගැනීම සඳහා මසුන් අලෙවියේ සංස්ථාවට අයත් වෙළඳපොල කොටස වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

දිවයිනේ යුද්ධමය වතාවරණය පහවී යාමත් සමග ධීවර කර්මාන්තය සිඝ්‍රලෙස දියුණු වෙමින් පවත්නා තත්වය යටතේ ලංකා ධීවර සංස්ථාව වෙතද රජයේ ආයතනයත් ලෙස සුවිශේෂ කාර්යභාර්ය පැවරී ඇත. එමෙන්ම මසුන් අලෙවිය විවෘත වෙළඳපොළ තරගකාරීත්වය මත තිරණය වන්නක් බැවින් සංස්ථාව විසින් කළමනාකරණ උපායමාර්ග වන මිලප්‍රතිපත්තිය , භාණ්ඩ (මසුන් වර්ග) ප්‍රභේදයන්, වෙළඳපොල විවිධාංගීකරණය, අලෙවි ප්‍රවර්ධනය යනාදී කළමනාකරණ උපාය මාර්ග තරගකාරිත්ව වෙළඳපොල ජයග්‍රහණය කරගැනීම සඳහා සාර්ථකව දියත් කොට ඇත.

1. **මසුන් මිලදීගැනීම හා අලෙවිය**

ධීවර ප්‍රජාවගේ මසුන් අස්වැන්න සෘජුවම සංස්ථාවට මිලදීගත හැකිනම් වඩා හොඳ මිලක් ඔවුන්ට ලබාදීමට හැකියාව ඇත. එමෙන්ම ඒ තුලින් පාරිභෝගිකයා වෙත තත්වයෙන් උසස් මසුන් අඩුමිලට ලබාදීමට හැකිවනු ඇත. මෙය සංස්ථාවේ දියුණුවටද සෘජු බලපෑමක් වේ. යාපනය , පේසාලේ පේදුරුතුඩුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල මසුන් අස්වැන්න මිලදීගැනීමේ වැඩපිළිවෙල ව්‍යාප්ත කිරීම හා එම ප්‍රදේශවල වෙසෙන ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම උදෙසා ධීවර ගම්මානවලට ගොස් ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා සාර්ථක ක්‍රියාමාර්ග ගන්නා ලදි. එමෙන්ම වර්ෂය තුලදී නව මිලදීගැණුම් මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංස්ථාවේ මසුන් මිලදීගැනීම වැඩිකරගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව **2013** වර්ෂය තුලදී මෙ.ටො. **4115** ක මසුන් තොගයක් සංස්ථාව මිලදීගත් අතර මෙය සෘජු මිලදීගැණුම් මෙ.ටො. **2732** ක් , විදේශීය යාත්‍රා සමාගම් වෙතින් මෙ.ටො. **1012** සහ ආනයනය කිරීම් තුලින් මෙෙ.ටො. **371** ලෙස සමන්විත වේ.

පැලියගොඩ නවීන අංගෝපාංග වලින් හා වඩාත් පුළුල් වූ පහසුකම් වලින් සමන්විත ඇති නවීන මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු මගපෙන්වීම හා ආශිර්වාදය යටතේ පත්කරන ලද කළමණාකරණ භාරය විසින් පාලනය වන අතර මෙහි කළමනාකරණ කටයුතු ලංකා ධීවර සංස්ථාව විසින් ඉටුකරනු ලබයි. එමෙන්ම මෙහි ඇතුලත් පතුරු අයිස් යන්ත්‍රාගාරය සහ ශීතාගාරයද ලංකා ධීවර සංස්ථාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලැබේ.

**2013** වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව මසුන් මෙ.ටො. **3982** ක් සිය අලෙවිසැල් ජාලය ජංගම රිය අලෙවි ව්‍යාපෘතිය, ලංකා ස.තො.ස හා කෝප් සිටි අලෙවිසැල් සහ රජයේ රෝහල් මසුන් සැපයීම තුලින් අලෙවිකර ගැනීමට හැකියාව ලැබුණි.

2. **<u>අයිස් නිෂ්පාදනය හා අලෙවිය</u>**

ලංකා ධීවර සංස්ථාවේ තවත් එක් ආදායම් උත්පාදන අංශයක් අයිස් නිෂ්පාදනය හා අලෙවිය . , ගාල්ල අනුරාධපුරය, බේරුවල, හම්බන්තොට සහ මෝදර අයිස් යන්ත්‍රාගාරවල නිෂ්පාදනය තුලින් මෙ.ටො. **21469** ක අලෙවිය ලගා කර ගැනීමට හැකිවිය.

3. **<u>විදේශීය මසුන් යාත්‍රා මෙහෙයුම් ක්‍රියාවලිය</u>**

සමාලෝචිත වර්ෂය තුලදී විදේශයාත්‍රා සමාගම් විසින් ගොඩබාන ලද මසුන් තොගයෙන් සංස්ථාවට විශාල ආදායමක් ලබාගැනීමට හැකියාව ලැබුණි. විදේශ යාත්‍රා **250** ක් මෝදර ධීවර වරායට පැමිණ ඇත. එකග වූ මිලකට යටත්ව සංස්ථාව වෙත එකී සමාගම් විසින් ගොඩබාන මසුන් තොගයෙන් 10% ක ප්‍රමාණය ලෙස මෙ.ටො. **1012** ක් වර්ෂය තුලදී ලබාදී තිබුණි.

4. **<u>මසුන් ටින්කිරීමේ ව්‍යාපෘතිය</u>**

ලංකා ධීවර සංස්ථාව සහ සී/ස හැපිකුක් ෆුඩ් ලංකා (පුද්) සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ගාල්ල ලංකා ධීවර සංස්ථා පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ටින්කල මසුන් නිෂ්පාදන කර්මාන්තශාලාව CEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලැබේ.

## සේවාවන්

5. **<u>ශීතාගාර පහසුකම් සහ සැකසුම් පහසුකම් සැලසීම</u>**

මෝදර පිහිටි ප්‍රධාන ශීතාගාරය සංස්ථා මසුන් අලෙවියේ කේන්ද්‍රස්ථානය වේ. එමෙන්ම ශීතාගාර ගබඩා පහසුකම් , සැකසුම් ප්‍රදේශ පහසුකම් සංස්ථා විධායකයන් වෙත මෙන්ම බාහිර පාර්ශවයන් වෙතද ලබාදෙන ලදි.

6. **<u>සංචාරක බංගලා පහසුකම්</u>**

නුවරඑළිය, කළමැටිය සහ මින්නේරිය නගරයන්හි පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලා තුලින් ආකර්ෂනීය හා පලපුරුදු කාර්ය මණ්ඩලයක සේවය මහජනතාව වෙත ලබාදීමට පියවර ගෙන ඇත.

7. **<u>ලාභාලාභ</u>**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු වලින් රුමිලියන **54.45** ක ශුද්ධ අලාභයක් වාර්තා වී ඇත. මෙය පසුගිය වර්ෂයේ රු.මිලියන **41.76** කි.

ජගත් කුමාර පෙරේරා
සභාපති

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

**2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාලසීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනද සමග ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් ඉදිරිපත් කරසිටී.

ලංකා ධීවර සංස්ථාව **1957** අංක **49** දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ **1964** වර්ෂයේදී පිහිටුවන ලදි.

ලංකා ධීවර සංස්ථාව ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවත්නා අතර සංස්ථාව විසින් **2013** වර්ෂය තුලදී කරගෙන යනු ලැබූ කටයුතු පහත ආකාරයට සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- දේශීය වශයෙන් මසුන් මිලදීගැනීම හා ආනයනය කිරීම
- තොග සහ සිල්ලර පදනම මත මසුන් අලෙවිකිරීම
- මත්ස්‍ය අතුරු නිෂ්පාදන මිලදීගැනීම සහ අලෙවිය
- අයිස් නිෂ්පාදනය සහ අලෙවිය
- ශීතාගාර පහසුකම් සැපයීම
- CEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදිත ටින්කල මසුන් අලෙවිය.

**<u>ව්‍යාපාරික කටයුතු සමාලෝචනය</u>**

සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් සභාපතිගේ සමාලෝචනය මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ වැදගත් කොටසක් ලෙස සැලකිය යුතුවේ.


**<u>මූල්‍ය ව්‍යුහය</u>**

පසුගිය වර්ෂ කිහිපය තුල සංස්ථාවේ සමස්ථ ආදායම රුබිලියනය ඉක්මවූ වටිනාකමක් වන අතර සමස්ථ ආදායම වැඩිවීමට දිප ව්‍යාප්තව ක්‍රියාත්මක කල මසුන් අලෙවිසැල් ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙල සෘජු දායකත්වය දරා ඇත. සමස්ථ ශුද්ධ ලාභාලාභ පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී , **2010** , **2011** හා **2012** වර්ෂ සැලකිය යුතු ලෙස පිළිවෙලින් රුමිලියන **59.42**, රුමිලියන **68.97** රුමිලියන **41.76** අඩුවී අනතුරුව **2013** වර්ෂයේදී රු. මිලියන **54.45** ක් දක්වා ශුද්ධ අලාභයේ සුළු වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

සාරාංශගත මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තාව පහත දක්වා ඇත.


## සමස්ථ ආදායම හා ලාභ/අලාභ විස්තරය

| වර්ෂය | සමස්ථ ආදායම රු.මිලියන | දළ ලාභය රු.මිලියන | ශුද්ධ ලාභ/අලාභ රු.මිලියන |
|---|---|---|---|
| 2009 | 912 | 258.48 | (103.90) |
| 2010 | 1309 | 384.16 | (59.40) |
| 2011 | 1977 | 605.17 | (68.97) |
| 2012 | 2079 | 701.19 | (41.76) |
| 2013 | 1940 | 657 | (54.45) |




## මසුන් මිලදීගැණුම් , අලෙවිය හා දළ ලාභ විස්තරය

| වර්ෂය | මසුන් මිලදීගැනීමේ වටිනාකම රු.මිලියන | මසුන් අලෙවි වටිනාකම රු.මිලියන | දළ ලාභ වටිනාකම රු.මිලියන |
|---|---|---|---|
| 2009 | 602.98 | 806.65 | 168.95 |
| 2010 | 917.96 | 1206.28 | 300.89 |
| 2011 | 1350.58 | 1840.04 | 485.00 |
| 2012 | 1338.91 | 1900.65 | 583.25 |
| 2013 | 1732.95 | 1155.18 | 537.38 |




## අයිස් අලෙවි වටිනාකම

| වර්ෂය | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.මි. |
|---|---|---|
| 2009 | 22055 | 67.42 |
| 2010 | 24288 | 65.18 |
| 2011 | 21894 | 76.92 |
| 2012 | 24233 | 91.28 |
| 2013 | 21469 | 97.58 |




## ශීතාගාර ආදායම

| වර්ෂය | රු.මිලියන |
|---|---|
| 2009 | 35.20 |
| 2010 | 35.24 |
| 2011 | 23.67 |
| 2012 | 15.82 |
| 2013 | 19.64 |



## ටින්කල මුසුන් මිළදීගැනීම හා අලෙවිය

| වර්ෂය | මිළදීගැණුම් වටිනාකම රු.මිලියන | විකුණුම් වටිනාකම රු.මිලියන | පුරස්කාර ආදායම රු.මිලියන |
|---|---|---|---|
| 2012 | 35.23 | 33.59 | 3.93 |
| 2013 | 88.76 | 89.55 | 6.76 |



**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| විධායක නිලධාරීන් | - | 75 |
| කළමනාකාරිත්ව පුහුණු | - | 01 |
| තාක්ෂණික නිලධාරීන් | - | 248 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | - | 485 |
| කණිෂ්ඨ සේවකයින් | - | 466 |
| | | 1275 |
| | | == |

**සුභසාධන කටයුතු**

- සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සය වෙනුවෙන් සංස්ථාවේ සියළුම සේවකයින් වෙත නොමිලේ මසුන් කිලෝ දෙකක් බැගින් ලබාදෙන ලදි.
- සිංගර් ආයතනය විසින් පහසු ගෙවීමේ පදනම මත විදුලි උපකරණ ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙනලදි.
- අබාන්ස් ආයතනය විසින් පහසු ගෙවීමේ පදනම මත දුරකථන හා පරිගණක යන්ත්‍ර ලබාගැනීමට අවශය කටයුතු සලස්වා දෙනලදි.
- ටී.වී.එස් ලංකා (පුද්ගලික) සමාගම විසින් පහසු ගෙවීමේ පදනමමත යතුරු පැදි ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙනලදි.
- හේමාස් සර්ජිකල් ඇන්ඩ් ඩයෝග්සිස් (පුද්) සමාගම මගින් නොමිලේ දියවැඩියා පරීක්ෂාව සහ Freestyle Optium Glucose Meter උපකණය විශේෂ දීමනාවක් සහිතව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙනලදි.
- ස්වර්ණමහල් ආයතනයේ රත්භාණ්ඩ ගෙවීමේ පදනම මත ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙනලදි.
- ශ්‍රී ලංකා ටෙලිකොම් හඳුන්වාදී ඇති සිටිලින්ක් දුරකථන නොමිලේ ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙනලදි.

**විනය ක්‍රියාමාර්ග**

වැඩ තහනම් කිරීම් සංඛ්‍යාව - 01
සේවයෙන් පහකිරීම් සංඛ්‍යාව - 02

**විධායක තනතුරු සඳහා බඳවාගැනීම්**

| | | |
|---|---|---|
| කළමනාකාර (කොන්ත්‍රාත් ) | - | 01 |
| කළමනාකාර (Iv ශ්‍රේණිය) | - | 01 |
| ජ්‍යෙෂ්ඨ උපදේශක (කොන්ත්‍රාත්) | - | 01 |

**විධායක තනතුරේ සේවයෙන් ඉවත්වීම**

| | | |
|---|---|---|
| විශ්‍රාම යාම | - | ප්‍රධාන කළමනාකාර (විශේෂ ශ්‍රේණිය) -01 |
| ඉල්ලා අස්වීම | - | වැඩබලන ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත්) -01 |

## ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාල කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත.

## ස්තූතිකිරීම

සංස්ථාවේ වර්ධනය සහ සාර්ථකත්වය උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් ලබාදෙන ලද සියලු වටිනා උපදෙස් ,සහයෝගය සහ මගපෙන්වීම් පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය සිය ස්තූතිය පළකර සිටී. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියළුම නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෘදයාංගම අගය කර සිටී. මෙම වර්ෂය තුළදී අපවෙත ලබාදෙන ලද සහයෝගය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියළු නිලධාරීන්හට අපගේ ස්තූතිය පළකර සිටිමු.

අපගේ වටිනා සම්පත වනුයේ සමස්ථ සේවක පිරිස වන අතර වර්ෂය තුළදී ඔවුන් ලබාදුන් සේවය සහ සහයෝගය පිළිබඳව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත අපගේ ස්තූතිය පළකර සිටිමු.

අපගේ වටිනා පාරිභෝගිකයන් . රාජ්‍ය ආයතන වෙතද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම ස්තූතිය ප්‍රකාශකර සිටින අතර ලංකා බැංකුව විසින් නිරන්තරයෙන් දක්වන ලද ඔවුන්ගේ සහයෝගය සහ අප කෙරෙහි දක්වන ලද විශ්වාසය පිළබඳව ලංකා බැංකු වෙත විශේෂ ස්තූතිය පළකර සිටිමු.

16 DGM (F)

Urgent.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. LP/B/CFC/FA/1/13/29 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015 දෙසැම්බර් 23 දින |

04 JAN 2016

ලංකා ධීවර සංස්ථාව 05 JAN 2016

සභාපති

ලංකා ධීවර සංස්ථාව

ලංකා ධීවර සංස්ථාවේ **2013** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **1971** අංක **38** දරන මුදල් පනතේ **14(2)(සී)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

MD/GM
pl. study this report
2016/01/05

DGM(F)/FM/Jhnsr:
pl. expedite the finalization of the Annual Report relevant to year 2013.
05/01/16

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } LP/B/CFC/FA/1/13/29    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 දෙසැම්බර් 23 දින

සභාපති

ලංකා ධීවර සංස්ථාව

**ලංකා ධීවර සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ලංකා ධීවර සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 මැයි 26 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑම නිසා හිමිකාරිත්වය හීන වී යාම හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතභාවයක් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතාවය සඳහා සහන ලබාගැනීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සංස්ථාවේ අතිරික්ත කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා මාස හයක කාලයක් රජයෙන් වැටුප් ගෙවීමට තීරණය කර තිබුණි. තවද සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය විමසා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කොට විෂය භාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු බවටද අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 | (i) කවර ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් භාවිතා කළද වාර්තා කරන දිනයේ සිට මාස 12කට පෙර හා මාස 12කට පසු අයකරගැනීමට බලාපොරොත්තු වන වත්කම් ද්‍රවශීලතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, රු.481,215,523 ක් වූ සමස්ත වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, |

| | | |
|---|---|---|
| | | ජංගම වත්කම් යටතේද රු.583,033,691 ක් වූ සමස්ත වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් යටතේද දක්වා තිබුණි. |
| | | (ii) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව වෙත ලැබුණ ප්‍රදාන රු.500,000 සහ වර්ෂයට අදාල ක්‍රමක්ෂය රු.81,014,528 ක් යොමුගත ප්‍රමිතිවල අවශ්‍යතාවයන්ට පටහැනිව එකිනෙකට හිලව් කර රු.80,514,527 ක් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රදාන යටතේ ගැලපුම් කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 | අපහරනය කිරීම සඳහා ඇති වටිනාකම රු.5,202,867 ක් වූ වත්කම්වල ස්වාභාවය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 | (i) සමාලෝචිත වර්ෂය තුළ මසුන් අලෙවිසැල් ස්ථාපනය කිරීම සඳහා මුදලින් දරනු ලැබූ වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දැක්විය යුතු වුවද ඊට පටහැනිව ප්‍රවර්තන වර්ෂයට අදාල ක්‍රමක්ෂය ගැලපීම් කිරීමෙන් පසුව ශුද්ධ අගයෙහි වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. |
| | | (ii) වර්ෂය තුළ ප්‍රාග්ධන නොනිමි වැඩ වෙනුවෙන් මුදලින් දරනු ලැබූ වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් කරනු වෙනුවට පෙර වර්ෂයත් ප්‍රවර්තන වර්ෂයත් අතර ප්‍රාග්ධන නොනිමි වැඩවල වෙනස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ගැලපුම් කර තිබුණි. |

| | |
|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 | අනාගතයේ දැකිය හැකි නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ බදු ලාභ ඇතිවන්නේ යැයි හැඟේ නම් මෙතෙක් ඉදිරියට ගෙන ආ බදු අලාභ මත විලම්භිත බදු වත්කම් හඳුනාගෙන ඒ සඳහා වෙන්කිරීම් කළයුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 | සංස්ථාව විසින් ගෙවනු ලබන කල්බදු වගකීම් ජංගම හා ජංගම නොවන බැරකම් ලෙස වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 | ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. |
| (උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 32 හා 39 | (i) මූල්‍ය වගකීම් හඳුනාගැනීම හා මැනීම සඳහා වූ ගිණුම්කරණ ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි.<br>(ii) ආයෝජන වර්ගීකරණ පදනම මත ආයෝජන මැනීම සිදුකළ යුතු වුවද සංස්ථාව විසින් රු.110,376,603 ක් වූ ආයෝජන සඳහා ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමේදී රු.92,163 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ජංගම වත්කම් යටතේ දැක්විය යුතු අපහරණය කිරීමට තීරණය කර තිබූ භාවිතයට ගත නොහැකි වටිනාකම රු.5,202,867 ක් වූ වත්කම් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැතියන් හා ණයහිමියන් යටතේ පිළිවෙලින් රු.2,160,434 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයන් හා රු.11,804,516 ක් වූ අසාමාන්‍ය හර ශේෂයන් දක්වා තිබුණි.

(ඈ) ගණනය කිරීමේ දෝෂ හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු පාරිතෝෂික දීමනා රු.102,250 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මසුන් විකුණුම් ආදායම්, සාරාංශගත විකුණුම් වාර්තා හා මාසික ගිණුම් වාර්තා සමඟ සැසඳීමේදී අලෙවි විධායකයන් 15 කට අදාලව රු.8,584,410 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ටින්කල මසුන් විකුණුම් ආදායම් උපලේඛණ,මාසික ගිණුම් වාර්තා සමඟ සැසඳීමේදී එක් එක් මාසවලදී නොසැසඳීම්වල මුළු වටිනාකම රු.1,659,742 ක් වී තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයන්හි වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් ඊට අදාල උපලේඛණ සමඟ පරීක්ෂා කිරීමේදී ස්ථාවර වත්කම් ගිණුම් විෂයයන් 10 කට අදාලව රු.17,534,668 ක වෙනසක් ද අනෙකුත් වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන්11 කට අදාලව රු.47,913,265 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ඉක්මවූ, වර්ෂ 05 ක සිට 10 ක් දක්වා වූ හා වර්ෂ 05 කට අඩු වෙළඳ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.22,087,398 ක් ,රු.16,927,018 ක් හා රු.192,592,335 ක් වී තිබූ අතර,ඒ තුල හඳුනානොගත් විවිධ ණයගැති ශේෂය රු.1,156,239 ක් විය. තවද රු.18,582,790 ක් වූ වෙළඳ ණයගැතියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. එම ණයගැති ශේෂයන් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 ක් ඉක්මවූ, වර්ෂ 01 ක සිට 03 ක් දක්වා වූ හා වර්ෂ 01 කට අඩු කාලයකට අයත් ශේෂයන් පිළිවෙලින් රු.28,055,475 ක් ,රු.3,346,947 ක් හා රු.272,773,832 ක් වී තිබුණි. රු.68,991,791 ක් වූ ණය හිමියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2015 අගෝස්තු 30 දින වන විට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් පිළිවෙලින් රු.34,797,364 ක් හා රු.400,696 ක් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බදු වටිනාකම රු.47,228,824 ක් වී තිබුණි.

(ඉ) කොඩ්බේ, පේසාලෙයි හා මඩකලපුව ඇතුළු ධීවර අලෙවිසැල් 06 ක අයිස් යන්ත්‍රාගාර ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.1,785,405 ක මුදලක් වසර 5 කට වඩා වැඩි කාලයක සිට ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබූ අතර, එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 261 හා 262 | මුදල් පොත් නිසිපරිදි යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වුවත්, සංස්ථාවේ ජංගම ගිණුමකට අදාල මුදල් පොත නිසි පරිදි පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | එක් එක් මාසය අවසානයේදී එහි ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවද, එක් ජංගම ගිණුමකට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි 371(2) | ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය අවසන් වූ විගසම නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 14 ක දී ලබාගෙන තිබූ එකතුව රු.887,410 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශයේ වියදම් නොදැරිය යුතු යැයි අවධාරණය කර තිබියදීත් ඉන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ වියදම් ලෙස රු.434,904 ක් දරා තිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 18 දිනැති අංක ඩීඑම්එස්/සී/3/එෆ්ආර්/8 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | අලෙවි උපදේශක තනතුරක් සඳහා වැටුපට අමතරව මාසිකව රු.45,000 බැගින් වූ දීමනාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ගෙවා තිබූ අතර,සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබූ මුළු දීමනාව රු.315,000 ක් විය. |
| (ඈ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා බඳවාගැනීම් පරිපාටියෙන් බැහැරව වයස අවුරුදු 70 ඉක්මවූ නිලධාරියෙකු සාමාන්‍යාධිකාරී / උපදේශක ලෙස කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පත්කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.54,446,218 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.41,763,563 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,682,655 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය වියදම් හා පරිපාලන වියදම් වැඩිවීමත්, විකුණුම් හා ආදායම් අඩුවීමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ 5 ක් තුල ලබා ඇති ශුද්ධ අලාභය රු.මිලියන 330 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේදී ද සමුච්චිත ශුද්ධ අලාභය රු.මිලියන 54ක් විය.

(ආ) සංස්ථාවේ ජංගම අනුපාතය 0.68:1 ක් වීම හේතුවෙන් සංස්ථාව උග්‍ර කාරක ප්‍රාග්ධන අර්බුදයකට මුහුණ දී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) මසුන් ,අයිස්,ශීතාගාර හා ටින්කල මසුන් යන අංශයන්හි දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පහත පරිදි විය.

| විස්තරය | දළ ලාභ ආන්තිකය 2013 සියයට | දළ ලාභ ආන්තිකය 2012 සියයට | ශුද්ධ ලාභ ආන්තිකය 2013 සියයට | ශුද්ධ ලාභ ආන්තිකය 2012 සියයට |
|---|---|---|---|---|
| මසුන් ආදායම | 45 | 44 | (1.3) | (0.97) |
| අයිස් ආදායම | 294 | 326 | (12.6) | (8.3) |
| ශීතාගාර ආදායම | 2,882 | 4,429 | (34.7) | (27) |
| ටින්කල මසුන් ආදායම | 1.6 | (1.1) | (3.5) | (10.7) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අයිස් ආදායමේ සහ ශීතාගාර ආදායමේ දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බෙදාහැරීමේ වියදම්,මූල්‍ය වියදම් හා විවිධ වියදම්වල වැඩිවීම හේතුවී තිබුණි.

(ii) මසුන් ආදායමේ ශුද්ධ ලාභ ආන්තිකය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම්, මූල්‍ය වියදම් හා පොදුකාර්ය වියදම් වෙන්කිරීම් වැඩිවීම හේතුවී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අලෙවි අංශවල වියදම් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | වර්ෂය සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| මසුන් අලෙවි අංශය | 19,464,150 | 458,956 | 4,141 |
| අයිස් අලෙවි අංශය | 1,558,921 | 887,531 | 75 |
| ශීතාගාර අංශය | 606,931 | 19,627 | 2,992 |
| ටින්කළ මසුන් අලෙවි අංශය | 2,986,807 | 24,985 | 11,854 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මසුන් අලෙවි ප්‍රමාණය මෙ.ටො.23 කින් හා අලෙවි ආදායම රු.මිලියන 168 කින් අඩුවී තිබුණු අතර අයිස් අලෙවි ප්‍රමාණය මෙ.ටො.1716 කින් අඩුවී අලෙවි ආදායම රු.මිලියන 2 කින් වැඩිවී තිබුණි. එසේම ශීතාගාරවලින් ලද ආදායම රු.මිලියන 1 කින් අඩුවී තිබූ අතර,වියදම රු.මිලියන 3 කින් වැඩිවී තිබුණි.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 745 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1,128 ක් වී තිබිණි.ඒ අනුව සියයට 51 ක අතිරික්ත සේවක සංඛ්‍යාවක් සංස්ථාවේ සේවය කිරීම හේතුකොටගෙන දැඩි මූල්‍ය අර්බුදයක් ඇති වී තිබුණි.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ණය පදනම මත මසුන් සැපයීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබුණද, ණයට මසුන් සැපයීම හේතුකොටගෙන 2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට ලැබීමට ඇති අක්‍රියව පවතින ණය ශේෂය රු.33,485,685 ක් වී තිබුණි.

(ආ) රජයේ රෝහල් සඳහා මසුන් ලබාදීම වෙනුවෙන් සංස්ථාවට අයවීමට ඇති ණය ශේෂය රු.53,086,699 ක් වී තිබූ අතර, එම ණය අයකරගැනීම ඉතාමත්ම දුර්වල මට්ටමක පැවතුනි.

(ඇ) විධිමත් පරිදි පවරා නොගත් රු.1,229,000 ක වටිනාකමකින් යුත් සිංහපුර සංචාරක බංගලාවේ අයිතිය නීත්‍යානුකූල ලෙස සංස්ථාව වෙත ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

බැංකු ගිණුම් 4 ක එකතුව රු.57,948 ක් වූ ශේෂයක් වර්ෂ 04 ක සිට අක්‍රීය තත්ත්වයේ පැවතුනි.

4.5 ආර්ථික නොවන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත පරිදි පාරිතෝෂික මුදල් හා විදුලි වියදම් නොගෙවීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය තුළ දඩ මුදල් ලෙස පිළිවෙලින් රු.186,678 ක් සහ රු.529,123 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) චෙක්පත් අගරුවීම් හේතුකොටගෙන අයිරා පොළී ලෙස රු.17,456,853 ක් ගෙවා තිබුණි.

4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ලංකා ධීවර සංස්ථාවේ මූලික අරමුණු වලින් බැහැරව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් පුද්ගලික හා රාජ්‍ය ආයතන වෙත රු.3,090,165 ක් හා රු.1,138,328 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

4.7 අයවැය පාලනය

-------------------

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) මසුන් මිලදී ගැනීම හා අලෙවි කිරීම

(ආ) ගෙවීම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) බදු ගෙවීම

(ඉ) අත්තිකාරම් ගෙවීම්

(ඊ) අයවැය පාලනය

(උ) කාර්ය මණ්ඩල පරිපාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு
Ministry of Fisheries & Aquatic Resources Development

CEYFISH

# ලංකා ධීවර සංස්ථාව
# இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்
# CEYLON FISHERIES CORPORATION

දුරකථනය / தொலைபேசி / Telephone: Chairman +94112523689; General +94112540455, +94112523227, +94112523228
ෆැක්ස් අංකය / தொலை நகல் / Fax No.: +94112523385

මගේ අංකය / எனது இல. / My No.: CFC/FD/AUD/2013
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date:

2014-06-09

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**ලංකා ධීවර සංස්ථාවේ 2013-දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඔබගේ අංක AF/B/CFC/FA/12 හා 2014-05-30 දිනැතිව අපවෙත එවා තිබූ කෙටුම්පත් විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව අපගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ ඇතුලත් වාර්තාව මේ සමග ඉදිරිපත්කරමි.

මෙයට,

විශ්වාසී

මහිල් සේනාරත්න
සභාපති
ලංකා ධීවර සංස්ථාව

නො.15 රොක් හවුස් පටුමග, කොළඹ 15. இல. 15, றாக் ஹவுஸ் ஒழுங்கை, கொழும்பு - 15. No. 15, Rock House Lane, Colombo 15.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන් | රු.ශත 2013-01-01 දිනට | රු.ශත 2013-12-31 දිනට |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 01/02 | 1,708,561,170 | 497,258,614 |
| ප්‍රාග්ධන නොනිම් වැඩ | | 1,452,920 | 1,270,200 |
| ස්ථාවර තැන්පතු | | 200,000 | 200,000 |
| වෙනත් ආයෝජන | | 110,376,603 | 110,376,603 |
| ලං.ධී.නි.සංස්ථාවේ ලැබිය යුතු | | 17,363,486 | 17,363,486 |
| බැහැර කලයුතු වත්කම් | | 5,202,867 | 5,202,867 |
| අලෙවිසැල් ඉදිකිරීමේ ප්‍රාග්ධන පිරිවැය | | 21,986,041 | 27,096,238 |
| | | **1,865,143,087** | **658,768,008** |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොග | | 68,755,127 | 87,064,565 |
| වෙළඳ නොවන තොග | | 14,465,909 | 16,345,682 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු | 3 | 481,215,523 | 382,429,023 |
| ලැබියු යුතු තැන්පත් | | 25,140,995 | 22,732,535 |
| මුදල් හා ආසන්න මුදල් | 4 | 35,606,238 | 16,850,978 |
| | | **625,183,792** | **525,422,782** |
| වත්කම් එකතුව | | **2,490,326,878** | **1,184,190,790** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන දායකත්වය** | | 326,609,805 | 326,609,805 |
| ප්‍රාග්ධන සංචිතය | | 24,258,241 | 24,258,241 |
| ප්‍රත්‍යාගණිත සංචිතය | | 1,397,655,531 | 109,487,330 |
| ප්‍රදාන | 5 | 369,840,088 | 450,354,615 |
| රදවාගත් ඉපයුම් | 6 | **(707,351,433)** | (655,011,968) |
| ස්කන්ධ ප්‍රාග්ධනය | | **1,411,012,233** | **255,698,024** |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරතෝපිත වෙන්කිරීම් | 7 | 62,205,170 | 82,651,919 |
| දිගුකාලීන ණය | 8 | 111,801,919 | 93,706,806 |
| | | **174,007,089** | **176,358,725** |
| ජංගම වගකීම් | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 9 | 583,033,691 | 473,753,766 |
| කෙටිකාලීන ණය | 10 | 151,280,990 | 158,960,739 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 11 | 34,340,141 | 28,547,491 |
| බැංකු අයිරාව | | **136,652,735** | 90,872,046 |
| | | **905,307,557** | **752,134,041** |
| ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්වල එකතුව | | **2,490,326,878** | **1,184,190,790** |
| | | | - |

……………………….

**මුදල් කළමනාකාර**

ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන්කොට අනුමත කරන ලදි.

…………………. ………………….

**සභාපති** **කළමනාකාර අධ්‍යක්ෂ**

## 2013-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| | | රුපියල් | රුපියල් |
| මුළු පිරිවැටුම | 12 | **1,969,485,805** | 2,078,840,744 |
| විකුණුම් පිරිවැය | | **1,312,123,147** | 1,402,607,988 |
| දළ ලාභය | | **657,362,659** | 676,232,757 |
| වෙනත් ආදායම් | 13 | 38,789,756 | 54,017,793 |
| ක්‍රියාකාරි නොවන ආදායම් | 14 | 16,729,938 | - |
| අලෙවි හා බෙදාහැරීමේ වියදම් | 15 | 115,740,208 | 143,345,030 |
| පරිපාලන වියදම් | 16 | 592,508,915 | 570,553,131 |
| වෙනත් වියදම් | 17 | 22,785,382 | 29,146,289 |
| මූල්‍ය වියදම් | 18 | 36,294,065 | 28,969,663 |
| | | **767,328,570** | **772,014,113** |
| බදු පෙර ශුද්ධ ලාභය / (අලාභය) | | **(54,446,218)** | **(41,763,563)** |
| ආදායම් බදු වියදම් | | **-** | - |
| වර්ෂයේ ශුද්ධ ලාභය/(අලාභය) | | **(54,446,218)** | **(41,763,563)** |
| වෙනත් විස්තීරණ ආදායම් | | | |
| විදේශ ගණුදෙනුවලට අදාල විනිමය ලාභ/අලාභ | | **-** | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 1,288,168,202 | - |
| මූල්‍ය වත්කම් විකුණුම් - ලාභ/අලාභ | | - | - |
| විශ්‍රාම සැලසුම් - සත්‍ය ලාභ /අලාභ | | 16,729,938 | - |
| වෙනත් විස්තීරණ ආදායම් උප එකතුව | | **1,304,898,140** | **-** |
| සමස්ථ විස්තීරණ ආදායම | | **1,250,451,922** | **(41,763,563)** |

## 2013-12-31 දිනෙන් අවසන් වර්ෂයේ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | රු.ශත | රු.ශත |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂයට අදාල ශුද්ධ ලාභය (අලාභය) | | (54,446,218) | |
| **ගැලපුම්** | | | |
| ක්ෂය කිරීම් | 22 | 94,875,448 | |
| ක්‍රමක්ෂය අනුව ක්ෂයවීම් | 22 | (81,014,528) | |
| විදේශ විනිමය (ලාභ) | | (3,505) | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 8 | (16,729,938) | |
| ආයෝජන ආදායම් | | (472,627) | |
| පොලී වියදම් | | 18,837,212 | |
| ස්ථාවර වත්කම් බැහැරකිරීම් ලාභ | | (3,845,448) | |
| පූර්ව වර්ෂ ගැලපුම් | | (84,298) | |
| **කාරක ප්‍රාග්ධන ගැලපුම් කිරීමට පෙර මෙහෙයුම් ලාභ (අලාභ)** | | **(42,883,901)** | |
| වෙළඳ හා අනෙකුත් ලැබීම්වල අඩුවීම | 23 | (101,194,960) | |
| තොග වැඩිවීම | 24 | 20,189,211 | |
| ණය හිමියන්ගේ අඩුවීම | 25 | 115,072,576 | |
| මෙහෙයුම් වලට යෙදවූ ශුද්ධ මුදල් වටිනාකම | | **(8,817,074)** | |
| පාරිතෝෂික ගෙවීම් | 8 | (1,525,759) | |
| පොලී ගෙවීම් | | (18,837,212) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **(29,180,045)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදීගැනීම් | 2 | (18,009,803) | |
| අලෙවිසැල් ඉදිකිරීමේ පිරිවැය වැඩිවීම | 26 | 5,110,197 | |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලැබීම් | | 3,845,448 | |
| ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු | | (182,720) | |
| විදේශ විනිමය ලාභ | | | |
| පොලී ලැබීම් | | 3,505 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් උපයෝගී කොටගත් | | 472,627 | |
| ශුද්ධ මුදල් වටිනාකම | | | **(8,760,746)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය.** | | | |
| ලංකා බැංකු දිගුකාලීන ණය ලැබීම් | | (21,795,428) | |
| අමාත්‍යාංශ ප්‍රදාන ලැබීම් | | 36,858,331 | |
| ප්‍රදාන ලැබීම් | | 500,000 | |
| දිගුකාලීන ණය (ස්පිරිට් වින්ඩ් සමාගම) | 27 | (4,647,539) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් වටිනාකම | | | **10,915,364** |
| මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩිවීම | | | **(27,025,428)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා ආසන්න මුදල් ශේෂයෙ | 28 | | (74,021,068) |
| වර්ෂය අවසානයේ මුදල් හා ආසන්න මුදල් ශේෂය | 28 | | (101,046,496) |

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය

| | රු.ශත<br>ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන | රු.ශත<br>ප්‍රාග්ධන සංචිත | රු.ශත<br>ප්‍රත්‍යාගණිත සංචිත | රු.ශත<br>ප්‍රධාන | රු.ශත<br>රඳවාගත් ලාභ/(අලාභ) | රු.ශත<br>එකතුව |
|---|---|---|---|---|---|---|
| **2012 ජනවාරි 01දිනට ශේෂය** | **376,709,648** | **24,258,241** | **109,487,330** | **545,428,821** | **(612,507,527)** | **443,376,513** |
| **ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම** | - | - | - | - | - | - |
| **ප්‍රත්‍යාගණිත ලාභ/(අලාභ)** | | | | | | **-** |
| **ලාභාංශ** | | | | | | **-** |
| **කොටස් නිකුතුව** | | | | | | **-** |
| **සමස්ථ විස්තීරණ ආදායම** | (50,099,843) | | | (95,074,206) | (42,504,441) | **(187,678,490)** |
| **2012-12-31 දිනට ශේෂය** | **326,609,805** | **24,258,241** | **109,487,330** | **450,354,615** | **(655,011,968)** | **255,698,024** |
| **ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම** | | | | | | **-** |
| **ප්‍රත්‍යාගණිත ලාභ/(අලාභ)** | | | 1,288,168,202 | | | **1,288,168,202** |
| **ලාභාංශ** | | | | | | **-** |
| **කොටස් නිකුතුව** | | | | | | **-** |
| **සමස්ථ විස්තීරණ ආදායම** | | | | (80,514,527) | (52,339,465) | **(132,853,992)** |
| **2013-12-31 දිනට ශේෂය** | 326,609,805 | 24,258,241 | 1,397,655,531 | 369,840,088 | (707,351,433) | 1,411,012,233 |

## 2. ස්ථාවර වත්කම් උපලේඛණය

රු.ශත

| වත්කමේ නම | වත්කම් පිරිවැය | | | | ක්ෂයවීම් | | | 2013-12-31 දිනට ලියාහරින ලද අගය රු.ශත |
|---|---|---|---|---|---|---|---|---|
| | 2013-01-01 දිනට පිරිවැය රු.ශත | කාලසීමාව තුල එකතුකිරීම් රු.ශත | කාලසීමාව තුල බැහැරකිරීම් රු.ශත | 2013-12-31 දිනට සමස්ථ පිරිවැය රු.ශත | 2012-01-01 දිනට ක්ෂය සමුච්චිත වෙන්කිරීම් වටනාකම | වර්ෂය අදාල ක්ෂයවීම් වටිනාකම | 2013-12-31 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් වටිනාකම | |
| ඉඩම් | 273,682 | - | | 273,682 | - | - | - | **273,682** |
| බද්දට ගත් ඉඩම් | 90,124,346 | - | | 90,124,346 | 31,788,014 | 1,792,014 | 33,580,028 | **56,544,318** |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 32,183,948 | 850,000 | | 33,033,948 | 19,976,886 | 1,792,782 | 21,769,668 | **11,264,279** |
| බෝට්ටු හා ආම්පන්න | 66,731,516 | - | | 66,731,516 | 66,689,596 | 41,900 | 66,731,496 | **20** |
| මෝටර් රථ වාහන කල්බුදගත් මෝටර්රථ | 301,435,909 | 4,113,267 | | 305,549,176 | 265,648,243 | 10,217,299 | 275,865,542 | **29,683,634** |
| ගෘහ භාණ්ඩ හා සවිකිරිම | 10,935,830 | 747,995 | | 11,683,825 | 5,993,353 | 733,624 | 6,726,976 | **4,956,849** |
| කාර්යාලීය උපකරණ | 22,519,209 | 563,545 | | 23,082,754 | 10,117,714 | 1,529,580 | 11,647,295 | **11,435,460** |
| අධි ශීතකරණ | 35,844,652 | 3,971,708 | | 39,816,360 | 15,791,431 | 3,114,591 | 18,906,022 | **20,910,338** |
| වෙනත් උපකරණ | 8,189,550 | 708,956 | | 8,898,506 | 7,354,479 | 184,562 | 7,539,041 | **1,359,466** |
| වෙනත් ස්ථාවර වත්කම් | 2,281,267 | **863,913** | | 3,145,180 | 359,549 | 197,471 | 557,020 | **2,588,161** |
| පරිගණක හා මෘදුකාංග | 2,892,650 | **1,713,714** | | 4,606,365 | 163,044 | 333,273 | 496,317 | **4,110,047** |
| පාපැදි | 18,710 | **-** | | 18,710 | 18,707 | | 18,707 | **3** |
| ශීතාගාර සහ බදු දී ඇති ශීතාගාර | 224,123,297 | **3,080,000** | | 227,203,298 | 175,382,742 | 11,402,160 | 186,784,903 | **40,418,395** |
| අයිස් යන්ත්‍රාගාර | 663,853,989 | **491,904** | | 664,345,893 | 371,055,443 | 62,525,086 | 433,580,529 | **230,765,364** |
| බරකිරීමේ තරාදි | 11,838,089 | **904,800** | | 12,742,889 | 5,648,829 | 1,011,107 | 6,659,936 | **6,082,953** |
| | **1,473,246,643** | **18,009,803** | **-** | **1,491,256,447** | **975,988,030** | **94,875,448** | **1,070,863,478** | **420,392,969** |

## 3. 2013-12-31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද දේපල පිරියත හා උපකරණ

රු.ශත

| | 2013-12-31 දිනට ලියාහැරි අගය | 2013-12-31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය/ඌණ තාවය |
|---|---|---|---|
| ඉඩම් | 273,682 | 822,700,950 | (822,427,268) |
| මෝටර් රථ වාහන | 29,683,634 | 157,250,000 | (127,566,366) |
| බෝට්ටු සහ ආම්පන්න | 20 | - | - |
| ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 56,544,318 | 372,559,350 | (316,015,032) |
| උපකරණ | 42,205,199 | 26,927,050 | 15,278,149 |
| අයිස් යන්ත්‍රාගාර හා ශීතාගාර | 271,183,759 | 317,336,000 | (46,152,241) |
| ලීබඩු හා සවිකිරීම් | 16,392,309 | 9,686,750 | 6,705,559 |
| පරිඝණක හා මෘදුකාංග | 4,110,047 | 2,101,050 | 2,008,997 |
| | 420,392,968 | 1,708,561,150 | (1,288,168,202) |
| අඩුකලා : | | | |
| බැහැරකරන ලද වත්කම් | | | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | (1,288,168,202) |

**4. වෙළඳ හා අනෙකුත් ලැබීම්** රු.ශත

| | උපලේඛන | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| වෙළඳ ණයගැතියෝ | 5.1 | 250,189,542 | 209,269,635 |
| සේවක ණයගැතියෝ | 5.2 | 24,160,443 | 21,491,771 |
| විවිධ හා වෙනත් ණයගැතියෝ | 5.3 | 91,975,288 | 83,935,846 |
| ජංගම ගිණුම් ශේෂ | 5.5 | 108,869,617 | 64,127,113 |
| ඇසුරුම් පෙට්ටි තොග ඌණතාවය | | 2,558,029 | 2,558,029 |
| පූර්ව ගෙවීම් | 5.4 | 3,462,604 | 1,046,629 |
| එකතුව | | **481,215,523** | **382,429,023** |

**5. මුදල් හා ආසන්න මුදල්** රු.ශත

| | උපලේඛන | වටිනාකම රු.ශත | | | |
|---|---|---|---|---|---|
| | | 2013.12.31 | | 2012.12.31 | |
| | | අත ඉතිරි මුදල් | බැංකු ශේෂය | අත ඉතිරි මුදල් | බැංකු ශේෂය |
| මසුන් අලෙවිය | 7 | 17,248,676 | 9,098,903 | 15,516,986 | |
| අයිස් අලෙවිය | 7 | 767,652 | 140,832 | 869,238 | |
| ශීතාගාරය | 7 | 847 | 5,283 | (4,136) | |
| වියළි කල මසුන් | 7 | 424,792 | - | 100,000 | |
| මධ්‍යම පරිපාලන | 7 | 1,076,290 | 6,842,962 | 368,890 | |
| එකතුව | | **19,518,258** | **16,087,980** | **16,850,978** | **-** |
| | | | **35,606,238** | | **16,850,978** |

**6. ප්‍රදාන** රු.ශත රු.ශත

| | වටිනාකම | |
|---|---|---|
| | 2013.12.31 | 2012.12.31 |
| එස්.ඩී.ඒ. ප්‍රදාන | 26,182,559 | 26,407,054 |
| අමාත්‍යාංශ ප්‍රදාන | 86,081,111 | 90,576,522 |
| Jica ප්‍රදාන | 251,300,533 | 327,323,039 |
| ඉෆ්ආඩ් ප්‍රදාන | 6,275,884 | 6,048,000 |
| එකතුව | 369,840,088 | 450,354,615 |

**7. රඳවාගත් ඉපයීම්**

| | රු.ශත 2013.12.31 | | රු.ශත 2012.12.31 | |
|---|---|---|---|---|
| වර්ෂයට අදාල ශුද්ධ ලාභය/(අලාභය) | | (54,446,218) | | (41,763,563) |
| **එකතුකලා : ඉදිරියට ගෙනආ අලාභය** | | | | |
| ඉදිරියට ගෙනආ අලාභය. | (655,011,968) | | (595,336,960) | |
| එකතුකලා පූර්ව වර්ෂ ගැලපුම් | 2,106,753 | (652,905,215) | (17,911,445) | (613,248,405) |
| ඉදිරියට ගෙන ගිය සමුච්චිත අලාභය | | **(707,351,433)** | | **(655,011,968)** |

**8. පාරිතෝෂික වෙන්කිරීම**

| | රු.ශත 2013.12.31 | රු.ශත 2012.12.31 |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ පාරිතෝපික වෙන්කිරීම | 82,651,919 | 74,889,329 |
| එකතුකලා : | | |
| වර්පයට අදාල පාරිතෝපික වෙන්කිරීම | - | 9,197,861 |
| අඩුකලා : | | |
| වර්පයට අදාල පාරිතෝපික ගෙවීම | 1,525,759 | 1,435,271 |
| වර්පයට අදාල ගෙවිය යුතු පාරිතෝපික | 2,191,053 | - |
| පාරිතෝපික අධි වෙන්කිරීම | 16,729,938 | - |
| ඉදිරියට ගෙන ගිය පාරිතෝපික වෙන්කිරීම් ශේෂය | **62,205,170** | **82,651,919** |

### 9. දිගුකාලීන ණය

| | රු.ශත 2013.12.31 | රු.ශත 2012.12.31 |
|---|---|---|
| දිගුකාලීන ණය - පීප්ල්ස් ලීසිං | 13,670,117 | 22,891,762 |
| දිගුකාලීන ණය - ලංකා බැංකු ලීසිං | 3,153,855 | |
| පාරිතෝෂික අධි වෙන්කිරීම | | |
| දිගුකාලීන ණය - ලංකා බැංකු ණයවරලිපි ආන්තික | 45,958,331 | |
| දිගුකාලීන ණය - ලංකා බැංකු | 49,019,616 | 70,815,044 |
| දිගුකාලීන ණය - සී.ඒ.එල්.එෆ් | 6,872,110 | 6,872,110 |
| දිගුකාලීන ණය වෙනුවෙන් වෙන්කිරීම | (6,872,110) | (6,872,110) |
| | **111,801,919** | **93,706,806** |

### 10. වෙළඳ හා අනෙකුත් ගෙවීම්

| | උප ලේඛන | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| වෙළඳ ණයහිමියෝ | 9.1 | 373,319,563 | 284,647,452 |
| උපචිත වියදම් | 9.2 | 23,286,737 | 20,467,371 |
| විවිධ ණයහිමියෝ | 9.3 | 172,457,148 | 157,308,524 |
| සේවක ණයහිමියෝ | 9.4 | 13,970,176 | 11,330,418 |
| | | **583,033,625** | **473,753,766** |

### 11. කෙටිකාලීන ණය

| | වටිනාකම රු.ශත | |
|---|---|---|
| | 2013.12.31 | 2012.12.31 |
| කෙටිකාලීන ණය අමාත්‍යාංශ | 30,000,000 | 30,000,000 |
| කෙටිකාලීන ණය මහා භාණ්ඩාගාර | 111,600,000 | 111,600,000 |
| ලංකා බැංකු ණයවරලිපි ආන්තික ණය | - | 9,100,000 |
| කෙටිකාලීන ණය - ලංකා බැංකු ලීසින් | 992,355 | - |
| කෙටිකාලීන ණය - පීපල්ස් ලීසින් | 127,136 | 1,330,868 |
| කෙටිකාලීන ණය - පීපල්ස් මූල්‍ය | 8,561,499 | 6,929,871 |
| | **151,280,990** | **158,960,739** |

### 12. ආපසු ගෙවිය යුතු තැන්පතු

| | උප ලේඛන | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 10 | 500,000 | 500,000 |
| අයිස් අලෙවිය | 10 | 27,000 | - |
| ටින් මාසුන් | 10 | 1,275,320 | |
| ශීතාගාරය | 10 | 2,790,560 | 2,635,560 |
| නිෂ්පාදන අංශය | 10 | 1,200,000 | 1,200,000 |
| මධ්‍යම පරිපාලන | 10 | 28,547,262 | 24,211,931 |
| එකතුව | | **34,340,141** | 28,547,491 |

## 13. ආංශික විස්තීරණ ආදායම් හා මධ්‍යම පරිපාලන පොදුකාර්ය වියදම් අවශෝෂණය

රු.ශත

| | සටහන් අංක | මසුන් අලෙවිය | අයිස් අලෙවිය | ශීතාගාර | ටින්කල මසුන් අංශය | මධ්‍යම පරිපාලන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැටුම** | 14 | | | | | | |
| ndysr wf,jsh | | 1,732,954,086 | 97,580,075 | 19,644,317 | 89,551,752 | - | 1,939,730,230 |
| වෙනත් විධායක මාරුකිරීම් - මසුන් අලෙවිය | | | | | | | - |
| - ශීතාගාර | | | | 20,647,276 | | | 20,647,276 |
| - අයිස් අලෙවිය | | - | 9,108,300 | | - | - | 9,108,300 |
| **මුළු පිරිවැටුම** | | 1,732,954,086 | 106,688,375 | 40,291,593 | 89,551,752 | - | 1,969,485,805 |
| **විකුණුම් පිරිවැය** | | | | | | | |
| ආරම්භක තොගය | | 85,555,373 | 99,115 | - | 1,258,037 | - | 86,912,525 |
| එකතුකලා : බාහිර මිලදීගැනීම් | 15 | 1,155,177,512 | 28,018,951 | 1,350,970 | 88,761,540 | - | 1,273,308,973 |
| වෙනත් විධායක මාරුකිරීම් - මසුන් අලෙවිය | | | | - | - | - | - |
| - ශීතාගාර | | 20,647,276 | | | | | 20,647,276 |
| - අයිස් අලෙවිය | | | 9,500 | | | | 9,500 |
| අඩුකලා : අවසාන තොගය | | 65,807,562 | 1,071,331 | - | 1,876,234 | | 68,755,127 |
| විකුණුම් පිරිවැය | | 1,195,572,599 | 27,046,735 | 1,350,970 | 88,143,343 | - | 1,312,123,147 |
| දළ ලාභය | | **537,381,487** | **79,641,640** | **38,940,623** | **1,408,409** | **-** | **657,362,659** |
| වෙනත් ආදායම් | 16 | 1,741,765 | 2,658,652 | | 6,765,535 | 27,623,804 | 38,789,756 |
| මෙහෙයුම් නොවන ලාභ | 17 | - | - | - | - | 16,729,938 | 16,729,938 |
| බෙදාහැරීමේ පිරිවැය | 18 | 88,971,655 | 783,720 | 29,134 | 117,000 | 25,838,699 | 115,740,208 |
| පරිපාලන පිරිවැය | 19 | 294,199,760 | 80,913,574 | 48,585,778 | 36,951 | 168,772,853 | 592,508,915 |
| වෙනත් වියදම් | 20 | 17,762,429 | 3,730,486 | 399,032 | 893,435 | - | 22,785,382 |
| මූල්‍ය පිරිවැය | 21 | 19,464,150 | 1,558,921 | 606,931 | 2,936,807 | 11,727,256 | 36,294,065 |
| වියදම්වල එකතුව | | **420,397,994** | **86,986,700** | **49,620,875** | **3,984,193** | **206,338,808** | **767,328,570** |
| ශුද්ධ ලාභය /(අලාභය) | | **118,725,258** | **(4,686,408)** | **(10,680,252)** | **4,189,751** | **(161,985,066)** | **(54,446,218)** |
| **මධ්‍යම පරිපාලන වියදම් අවශෝෂණය** | | | | | | | |
| අවශෝෂණ අනුපාතය % | | 87.99% | 5.42% | 2.05% | 4.55% | - | 100.00% |
| වියදම් අවශෝෂණ වටිනාකම | | (142,530,950) | (8,774,840) | (3,313,878) | (7,365,398) | 161,985,066 | - |
| ශුද්ධ ලාභය /(අලාභය) | | (23,805,692) | (13,461,248) | (13,994,130) | (3,175,647) | - | (54,446,218) |

## 12. අලෙවි පිරිවැටුම

| | උපලේඛණ | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 11.1 | 1,732,954,086 | 1,900,649,982 |
| අයිස් අලෙවිය | 11.2 | 106,688,375 | 104,062,324 |
| ශීතාගාර | | 40,291,593 | 40,536,873 |
| ටින් මසුන් | | 89,551,752 | 33,591,565 |
| එකතුව | | **1,969,485,805** | **2,078,840,744** |

## මිලදීගැනීම්

| | උපලේඛණ | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | | 1,155,177,512 | 1,338,905,012 |
| අයිස් අලෙවිය | 12.2 | 28,018,951 | 24,361,437 |
| ශීතාගාර | | 1,350,970 | 894,968 |
| ටින් මසුන් | | 88,761,540 | 35,233,368 |
| මධ්‍යම පරිපාලන | | - | 934,399 |
| එකතුව | | 1,273,308,973 | 1,400,329,184 |

## 13. වෙනත් ආදායම්

| | උපලේඛණ | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 13 | 1,741,765 | 2,823,050 |
| අයිස් අලෙවිය | 13 | 2,658,652 | 10,465,483 |
| ශීතාගාර | 13 | - | 25,000 |
| ටින් මසුන් | 13 | 6,765,535 | 3,929,090 |
| මධ්‍යම පරිපාලන | 13 | 27,623,804 | 36,775,170 |
| එකතුව | | 38,789,756 | 54,017,793 |

## 14.මෙහෙයුම් නොවන ආදායම්

**පාරිතෝෂික අධි වෙන්කිරීම**

| | රු.ශත | |
|---|---|---|
| | 2013.12.31 | |
| ඉදිරියට ගෙන ආ පාරිතෝෂික වෙන්කිරීම | | 82,651,919 |
| අඩුකලා : | | |
| වර්ෂය තුල පාරිතෝෂික ගෙවීම් | 1,525,759 | |
| වර්ෂයට අදාල ගෙවිය යුතු පාරිතෝෂිතය | 2,191,053 | |
| | | 3,716,811 |
| | | 78,935,108 |
| ඉදිරියට ගෙන ගිය පාරිතෝෂිත වෙන්කිරීම් ශේෂය | | 62,205,170 |
| පාරිතෝෂික වෙන්කිරීම් /ක්‍රියාකාරී නොවන මෙහෙයුම් ආදායම | | **16,729,938** |

## 15. බෙදාහැරීම් පිරිවැය

| | උපලේඛණ | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 14 | 88,971,655 | 139,899,647 |
| අයිස් අලෙවිය | 14 | 783,720 | 888,298 |
| ශීතාගාර | 14 | 29,134 | 132,906 |
| ටින් මසුන් | 14 | 117,000 | 3,815,971 |
| මධ්‍යම පරිපාලන | 14 | 25,838,699 | 23,569,527 |
| එකතුව | | 115,740,207 | 168,306,348 |

## 16. පරිපාලන පිරිවැය

| | උපලේඛණ | වටිනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 15 | 294,199,760 | 282,162,938 |
| අයිස් අලෙවිය | 15 | 80,913,574 | 80,800,349 |
| ශීතාගාර | 15 | 48,585,778 | 46,593,729 |
| ටින් මසුන් | 15 | 36,951 | 102,811 |
| මධ්‍යම පරිපාලන | 15 | 168,772,853 | 160,893,304 |
| එකතුව | | 592,508,915 | 570,553,131 |

## 17. වෙනත් වියදම්

| | උපලේඛණ | වර්තනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 16 | 17,762,429 | 21,041,414 |
| අයිස් අලෙවිය | 16 | 3,730,486 | 7,308,814 |
| ශීතාගාර | 16 | 399,032 | 460,146 |
| ටින් මසුන් | 16 | 893,435 | 335,916 |
| මධ්‍යම පරිපාලන | 16 | - | - |
| එකතුව | | 22,785,382 | 29,146,289 |

## 18. මූල්‍ය පිරිවැය

| | උපලේඛණ | වර්තනාකම රු.ශත | |
|---|---|---|---|
| | | 2013.12.31 | 2012.12.31 |
| මසුන් අලෙවිය | 17 | 19,464,150 | 458,956 |
| අයිස් අලෙවිය | 17 | 1,558,921 | 887,531 |
| ශීතාගාර | 17 | 606,931 | 19,627 |
| ටින් මසුන් | 17 | 2,936,807 | 24,985 |
| මධ්‍යම පරිපාලන | 17 | 11,727,256 | 27,578,565 |
| එකතුව | | 36,294,066 | 28,969,663 |

## 19. 2013 වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීම සහ ක්‍රමක්ෂය

රු.ශත

| | ක්ෂය වෙන්කිරීම් වටිනාකම | ක්‍රමක්ක්ෂය වෙන්කිරීම |
|---|---|---|
| මසුන් අලෙවිය | 13,498,305 | 8,240,372 |
| ශිතාගාර | 6,450,029 | 3,881,792 |
| ප්‍රධාන කාර්යාලය | 27,019,528 | 21,120,605 |
| ගාල්ල අයස් යන්ත්‍රාගරය | 36,391,936 | 36,321,684 |
| හම්බන්තොට අයිස්යන්ත්‍රාගාරය | 821,393 | 821,393 |
| බේරුවල අයිස්යන්ත්‍රාගාරය | 4,181,556 | 4,146,568 |
| මෝදරඅයිස්යන්ත්‍රාගාරය | 6,495,350 | 6,482,113 |
| පැලියගොඩ අයිස්යන්ත්‍රාගාරය | 17,351 | - |
| එකතුව | **94,875,448** | **81,014,528** |

## 20.වෙළඳ හා අනෙකුත් ලැබීම් අඩුවීම

රු.ශත

| | 2013-12-31 දිනට ශේෂය | 2012-12-31 දිනට ශේෂය | අඩුවීම |
|---|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 250,189,542 | 209,269,635 | (40,919,907) |
| සේවක ණයගැතියෝ | 24,160,443 | 21,491,771 | (2,668,672) |
| වෙනත් ණයගැතියෝ | 91,975,288 | 83,935,846 | (8,039,443) |
| ජංගම ගිණුම් ශේපය. | 108,869,617 | 64,127,113 | (44,742,504) |
| ඇසුරුම් පෙට්ටි තොග ඌණතාවය | 2,558,029 | 2,558,029 | - |
| පූර්ව ගෙවීම් | 3,462,604 | 1,046,629 | (2,415,974) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 25,140,995 | 22,732,535 | (2,408,460) |
| එකතුව | **506,356,518** | **405,161,558** | **(101,194,960)** |

## 21. තොග ශේෂ වැඩිවීම

රු.ශත

| | 2013-12-31 දිනට ශේෂය | 2012-12-31 දිනට ශේෂය | වැඩිවීම |
|---|---|---|---|
| වෙළඳ තොග | 68,755,127 | 87,064,565 | 18,309,438 |
| වෙළඳ නොවන තොග | 14,465,909 | 16,345,682 | 1,879,773 |
| එකතුව | **83,221,035** | **103,410,246** | **20,189,211** |

## 22. වෙළඳ ගෙවීම් අඩුවීම

රු.ශත

| | 2013-12-31 දිනට ශේෂය | 2012-12-31 දිනට ශේෂය | අඩුවීම |
|---|---|---|---|
| වෙළඳ ණයහිමියෝ | 373,319,563 | 284,647,452 | 88,672,111 |
| උපචිත වියදම් | 23,286,737 | 20,467,371 | 2,819,366 |
| විවිධ ණයහිමියෝ | 172,457,148 | 157,308,524 | 15,148,624 |
| සේවක ණයහිමියෝ | 13,970,176 | 11,330,418 | 2,639,758 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 34,340,141 | 28,547,491 | 5,792,651 |
| එකතුව | **617,373,766** | **502,301,256** | **115,072,510** |

## 23. අලෙවිසැල් ඉදිරකිරීම් පිරිවැය

රු.ශත

| | 2013-12-31 දිනට ශේෂය |
|---|---|
| වර්පය තුල අලෙවිසැල් ඉදිකිරීම පිරිවැය වැඩිවීම | 1,538,524 |
| වර්පයට අදාල අලෙවිසැල් ඉදිකිරීම් පිරිවැය | 6,648,721 |
| වර්පයට අදාල අලෙවිසැල් ඉදිකිරීම් පිරිවැය | 5,110,197 |

## 24. කල්බදු වගකීම් ගෙවීම

රු.ශත

| | 2013-12-31 දිනට ශේෂය |
|---|---|
| වර්පයට අදාල කල්බදු වගකීම් වැඩිවීම | 4,793,148 |
| වර්පය තුල කල්බදු වාරික ගෙවීම | 9,440,687 |
| ශුද්ධ කල්බදු වගකීම | (4,647,539) |

## 25. මුදල් හා ආසන්න මුදල්

රු.ශත

| | මුදල් හා බැංකු ශේෂය | බැංකු අයිරාව | එකතුව |
|---|---|---|---|
| වර්පයේ ආරම්භ දිනට මුදල් හා ආසන්න මුදල් | 16,850,978 | (90,872,046) | (74,021,068) |
| වර්පයේ අවසාන දිනට මුදල් හා ආසන්න මුදල් | 35,606,238 | (136,652,735) | (101,046,496) |

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1. **තත්ත්වාගණනය කල විගණන මතය**

**2013** දෙසැම්බර් **31** දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට කොන්දේසිගත විගණන මතයක් ප්‍රකාශ කොට ඇත.

විගණකාධිපති වාර්තාවේ පෙන්නුම් කර තිබූ කරුණු පිළිබඳව නිවැරදි කිරීමේ පියවරයන් ගෙන ඇත.

2.2. **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1. **සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම**

ඉදිරිපත් කොට ඇති නිරීක්ෂණ හා අදහස් දැක්වීමට එකඟ වන්නෙමු.

2.2.2. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - අංක 01**

(1). සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් හා ජංගම වගකීම් ද්‍රවශීලතාවය අනුව පෙලගස්වා ඇත. ඒ අනුව රු. 481,215,523/- ක වෙළඳ හා අනෙකුත් ලැබීම් ජංගම වත්කම් යටතේ ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව සටහන් කර ඇත.

එමෙන්ම රු.583,033,691/- ක් වූ. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකමද ජංගම වගකීම් යටතේ ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව සටහන් කර ඇත.

(II). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 (LKAS-20) - රාජ්‍ය ප්‍රදාන හා රාජ්‍ය සහනාධාර හෙළිදරව් කිරීම යන ප්‍රමිතියෙන් මෙකී ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම පිළිබඳව විස්තර දක්වා ඇත. එකී ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව රාජ්‍ය ප්‍රදාන පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 5**

**2013** වර්ෂයේදී ස්ථාවර වත්කම් භෞතිකව පරීක්ෂා කොට ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කිරීම හා පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් ශේෂය සමග සැසඳීම සිදුකරන ලද අතර එහිදී හඳුනාගත් බැහැර කලයුතු වත්කම් වටිනාකම නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් පොත්වලින් ලියාහැරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

1) ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකඟවන්නෙමු . සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අලෙවිසැල් ඉදිකිරීමට වැයවූ වියදම් හා ඒ වෙනුවෙන් ලැබුණු ප්‍රදාන ශුද්ධ අගය මත මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ නොදක්වා වෙන වෙනම අගයන් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට සටහන් කරගනිමු.

II) ඉදිරිපත් කර ඇති අදහස් දැක්වීමට එකගවන්නෙමු. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ප්‍රාග්ධන නොනිම් පැවති ශුද්ධ අගයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ඉදිරිපත් නොකර වෙන්වෙන් වශයෙන් අගයන් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට සටහන් කරගතිමු.

ඇ) **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12</u>**

ලංකා ධීවර සංස්ථාව දීර්ඝ කාලීනව බදු අලාභයන් වාර්තාවී ඇති බැවින් ඉදිරියට ගෙන ආ බදු අලාභය මත විලම්භිත බදු වත්කම් හදුනාගෙන ඒ සදහා වෙන් කිරීමක් සිදු නොකරයි. මේ පිළිබදව සටහනක් මගින් හෙළිදරව් කොට ඇත.

ඉ) **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17</u>**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17 හි නියමයන්ට අනුකූලව කල්බදු වගකීම ජංගම හා ජංගම නොවන බැරකම් ලෙස වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කොට ඇත.

ඊ) **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18</u>**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි නියමයන්ට අනුකූලව ආදායම් හදුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශවල සටහන් යටතේ හෙළිදරව් කොට ඇත.

උ) **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 32 හා 39</u>**

(I) (II) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 32 හා 39 නියමයන්ට අනුකූලව මූල්‍ය වගකීම් හදුනාගැනීම හා මැනීම සදහා වූ ගිණුම්කරණ ක්‍රමය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කොට ඇත.

මෙම ආයෝජනයට අදාල බද්ධ ව්‍යාපාරය (Joint Venture) සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවූ බැවින් එකී බද්ධ ව්‍යාපාරයට ආයෝජනය කරන ලද වත්කම් නැවත අත්පත් කරගැනීමට ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කොට ඇත.

2.2.3. **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

අ) මෙම අදහස් දැක්වීමට එකග නොවන්නෙමු. සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂය වටිනාකම නිවැරදිව ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

ආ) ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂාවේදී හදුනාගත් බැහැර කලයුතු ස්ථාවර වත්කම් ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කොට නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් පොත්වලින් ලියාහැරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ඇ) ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකගවන්නෙමු.

සමාලේචිත වර්ෂයට අදාල පුද්ගලික ණයගැති හා ණයහිමි යටතේ අසාමාන්‍ය බැර හා හර ශේෂයන් වාර්තාවන අතර එයට අදාල ගිණුම් සටහන් 2014 වර්ෂයට නිරවුල් කොට ඇත.

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක **39** ට අනුකූලව බලයලත් තක්සේරුකරුවෙකු විසින් (Actuary) 2013 වර්ෂයට අවසන් අදාල පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම ගණනයකොට ඒ අනුව ආදායම් ප්‍රකාශයට ගැලපීම් කලයුතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කොට ඇත.

2.2.4. **<u>නොසැසඳූ පාලන ගිණුම</u>**

අ) **<u>මසුන් විකුණුම් ආදායම</u>**

මාසික ගිණුම් පිලියෙල කරනුයේ කලමනාකරණ තීරණ ගැනීම සඳහා වන අතර සියළුම ගිණුම් සටහන් ගිණුම් පොත්වල සටහන් කිරීම තුලින් වාර්ෂික ගිණුම් පිලියෙල කිරීමේදී එකිනෙක මාසවලට අදාල මසුන් ආදායම මෙන්ම අනෙකුත් ආදායම් හා වියදම් වලට අදාල ගැලපුම් සටහන් කිරීමේදී මාසිකව පෙන්නුම් කරතිබූ දත්තයන් වල වෙනස්කම් පැවතියද වාර්ෂික ගිණුම් පිලියෙල කිරීමේදී ඒවා නිවැරදි කොට ඇත.

ආ). **<u>ටින්කල මසුන් විකුණුම් ආදායම</u>**

ටින්කල මසුන් විකුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වටිනාකම සමන්විතව ඇත්තේ විධායක හා එම අංශවලට අදාල මාසිකව පිලියෙල කරනු ලබන දෛනික පොත් විකුණුම් සාරාංශ ඇතුළු පොත්පත් හා වාර්තා පදනම් කොටගෙනය. මෙම සියළුම ගණක ලියකියවිලි හා පොත්පත් විගණනයට ඉදිරිපත්කොට ඇත.

ඇ) **2013-12-31** දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය හා එම දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තිරණ ආදායම් ප්‍රකාශය නිවැරදිව පිලියෙල කොට එයට අදාල උපලේඛනද සමග විගණනයට ඉදිරිපත් කර ඇත.

2.3. **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනයට වූ ණයගැති ශේෂයන්ට අදාල කාල

විශ්ලේෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කොට ඇත.

සංස්ථාවට අයවිය යුතු සියළුම හිග ණය අයකරගැනීම සඳහා විගණන හා කලමනාකරණ කමිටුව විසින් පරීක්ෂාකොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කොට ඇත. ඒ අනුව විශේෂයෙන්ම කල් ඉකුත්වූ ණය අයකරගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් එලෙස අයකරගත නොහැකි ණය සම්බන්ධයෙන් නියමිත ක්‍රියා පටිපාටින් අනුගමනය කොට පොත්වලින් ලියා හැරීමට කටයුතු කොට ඇත.

එමෙන්ම මසුන් අලෙවි හිග මුදල් පැවතීම වලක්වා ගැනීම සඳහා කලමනාකාරීත්වය විසින් සියළුම අලෙවි විධායක කලමනාකරුවන් වෙත උපදෙස් නිකුත්කොට අධීක්ෂණය කරනු ලැබේ.

(ආ) **2013-12-31** දිනට සම්පූර්ණ ණයහිමි ශේෂයන්ට අදාල ණයහිමි කාලවිශ්ලේෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කොට ඇත.

(ඇ) ලංකා ධීවර සංස්ථා සේවකයින්ගේ සේවා නියුක්ත භාරකාර අරමුදල් දායක කිසිදු හිගයක් නොමැති මාසිකව නියමිත දිනට ගෙවීම් කොට ඇත. එනමුත් සේවක අර්ථසාධක අරමුදල් දායක හිග මුදලක් තිබී විශේෂ භාණ්ඩාගාර ප්‍රතිපාදනයක් ලබාගෙන එය සම්පූර්ණයෙන් නිරවුල් කොට ඇත.

(ඇ) 2002-2004 දක්වා වූ වර්ෂවලට අදාල එකතුකල අගය මත බදු මුදලක් සහ වර්ෂයන්ට අදාල ආර්ථික සේවාගාස්තු හිග බදු වටිනාකම් හිග බදු ලෙස ගෙවීමට තිබ් මහා භාණ්ඩාගාරය විසින් විශේෂ ප්‍රතිපාදනයක් ලබාගෙන මේ වනවිට සම්පූර්ණ මුදලට නිරවුල් කොට ඇත.

(ඉ). අයිස් යන්ත්‍රාගාර ඉදිකිරීම වෙනුවෙන් වසර 05 කට වැඩි කාලයක සිට ගෙවියයුතු වියදම් ලෙස පෙන්නුම් කර ඇති රු. 1,785,405/- ක වටිනාකම ගෙවීම් ලාගී කිසිදු ඉල්ලීමක් කොට නොමැති බැවින් විධිමත් ක්‍රම වේදයන් අනුගමනය කොට පොත්වලින් ඉවත් කිරීමට පියවර ගෙන ඇත.

## 2.4. නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ). **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

i) **මූ.රෙ. 261 , හා 262 හා**

ii) **මූ.රෙ. 395 (ඇ)**

වාණිජ ව්‍යාපාරික කටයුතුවල නිරත ලංකා ධීවර සංස්ථාවේ ගිණුම් කටයුතු මේ දක්වා පරිගණකගතකර නොමැති බැවින් මුදල් පොත් ඇතුළු ගිණුම් කටයුතු සඳහා සැහෙන කාලයක් ගතවන අතර ප්‍රධාන කාර්යාලයේ වියදම් වලට වෙන්කොට තිබූ ලංකා බැංකුවේ අංක 7203562 දරණ ජංගම ගිණුමට අදාල මුදල් පොත ඇතුළු සියළුම බැංකු ජංගම ගිණුම්වලට අදාල මුදල් පොත් නිවැරදිව පිළියෙල කොට බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කොට 2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

iii) **මූ.රෙ.371 (2)**

ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම වන මසුන් අලෙවිය සහ අනෙකුත් අලෙවි කටයුතු වන ටින්කල මසුන් අයිස් හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන අලෙවි කටයුතුවලට අදාල සේවා හා යටිතල පහසුකම් සැලසීමේදී අත්‍යාවශ්‍ය වූත් ඉතා කඩිනමින් ඉටුකල යුතු කාර්යයන් සඳහා ඉහල කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව අත්තිකාරම් ලබාදීම සිදුකරනු ලබන අතර එලෙස ලබාදුන් අත්තිකාරම් පියවා ඇතත් අවස්ථා කිහිපයකදී ලබාගත් අත්තිකාරම් පියවා නොතිබූ බැවින් ඒ සම්බන්ධයෙන් අදාල සේවකයිනගෙන් අයකරගැනීම් හා ඔවුන් වෙත නැවත අත්තිකාරම් නොගෙවීමට කළමනාකාරිත්වය තීරණය කොට ඇත.

ආ) **2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 දරණ චක්‍රලේඛයේ 8.3.9. වගන්තිය**

ලාංකීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම හා මන්දපෝෂණය තුරන් කිරීම මෙන්ම ධීවර ප්‍රජාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම යනාදි අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ උපදෙස් හා මග පෙන්වීම් වලට අනුව ලංකා ධීවර සංස්ථාව විසින් මසුන් වෙළඳපොළේ මිල පාලනය කොට සහන මිලට මසුන් සැපයීම සඳහා සංස්ථාව සතු මසුන් අලෙවිසැල් ජාලය පුළුල් කිරීම සහ ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා මසුන් මිලදී කටයුතු සම්බන්ධ නව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතු වලදී ගරු අමාත්‍යතුමා සමග කාර්ය මණ්ඩලය විශේෂයෙන්ම මාධ්‍ය ඒකකය සහභාගීවන බැවින් ඔවුන් වෙත ලබාදී ඇති වාහනවල ඉන්ධන ලංකා ධීවර සංස්ථාව විසින් ලබාදීමට කටයුතු කරන ලදි.

මෙවන් අවස්ථාවලදී ඉන්ධන වෙනුවෙන් අමාත්‍යාංශය වෙත ලබාදී ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා වන රාජකාරී ගමන් සඳහා සංස්ථාවෙන් ඉන්ධන ලබාදෙන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් ඉල්ලීම් කර තිබුණි.

ඇ) **2006 දෙසැම්බර් 18 දිනැති DMS/C/3/FAR/8 කළමනාකරණ සේවා චක්‍රලේඛය**

ජනතාව වෙත සහනමිලට උසස් ගුණාත්මකබවින් යුත් මසුන් සැපයීම ලංකා ධීවර සංස්ථාවේ මූලික අරමුණ බැවින් එකී කාර්ය භාරය සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාව සතු අලෙවිසැල් ජාලය පුළුල් කරගනිමින් සහ ලංකා සතොස අලෙවිසැල් හරහා අධිශීතකල මසුන් සැපයීම ඇතුළු මසුන් අලෙවියට අදාල වැඩකටයුතු අධීක්ෂණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ දැනුවත් වීම මත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව අලෙවි උපදේශක තනතුරට ඒ සඳහා සුදුසුකම් ලද නිලධාරී මහතෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. ඔහුගේ සේවා පළපුරුද්ද සැලකිල්ලට ගෙන වැටුපට අමතරව දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව අලෙවි උපදේශක වෙත පවරා තිබූ කාර්ය භාරය සාර්ථකව ඉටුකර තිබූ අතර 2013 දෙසැම්බර් මාසයේදී මෙම නිලධාරී සංස්ථා සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

ඈ) **2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය**

කලක සිට ලංකා ධීවර සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තනතුර පුරප්පාඩුව පැවති අතර ඒ හේතුවෙන් මෙම තනතුරට අදාල රාජකාරී කටයුතු විශේෂයෙන් පරිපාලන කටයුතු අඩපනවීම වලකාලනු පිණිස ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ නිර්දේශය මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළපුරුද්ද ලබා ඇති විශ්‍රාමික නිලධාරී මහතෙකු ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකු ලෙස පත්කොට එම නිලධාරී විසින් සාමාන්‍යාධිකාරී තනතුරේ කටයුතු ආවරණය කිරීමට කටයුතු කර තිබුණි. 2014- දෙසැම්බර් මාසයේදී මොහුගේ කොන්ත්‍රාත් සේවය අවසන් කොට ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයට අදාල ශුද්ධ අලාභයේ වැඩිවීමක් පෙන්නුම් කොට ඇති අතර, 2013 වර්ෂයේ සමස්ථ ශුද්ධ අලාභය පෙර වර්ෂයට සාපේක්ෂව ඉහල අගයක් ගැනීමට බලපාන ලද හේතුන් කිහිපයක් පහත සඳහන් කරමි.

1. 2012 වර්ෂයට සාපේක්ෂව මසුන් අලෙවිය රු.මිලියන 167.69 කින් (9%) පහත වැටීම.

2. හක් බෙල්ලන් හා මුහුදු කුඩැල්ලන් (Sea Cucumber & Conch-shell) අපනයනය කිරීම වෙනුවෙන් සංස්ථාවට ලැබුණු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 16.8 කින් අඩුවීම.

3. ශීතාගාරයේ අළුත්වැඩියාවන් යථා පරිදි සිදුකිරීමට නොහැකිවීම මත මිලදීගෙන ගබඩාකරන ලද මසුන් තොගයෙන් FFC තත්වයට පත්වන මසුන් ප්‍රමාණය ඉහලයාම 2013 වර්ෂය තුලදී මේ යටතේ රු.මිලියන 5.2 පමණ අලාභයක් වාර්තාවී ඇත.

4. පසුගිය වර්ෂයට සාපේක්ෂව බැංකු පොලී වියදම් රු.මිලියන 7.3 ක වැඩිවීම හා සේවක වැටුප් වැඩිකිරීම හේතුවෙන් හේතුවෙන් පරිපාලන වියදම් රු.මිලියන 30කින් පමණ වැඩිවීම.

### 3.2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත්කොට ඇති නිරීක්ෂණයට එකගවන්නෙමු.

**වියදම්වල වැඩිවීම් හා අඩුවීම්**

මසුන් සැපයුම් කරුවන්ට ගෙවීම්කිරීම සඳහා භාවිතා කරන ලද අංක 1257 හා 1846 දරණ බැංකු ජංගම ගිණුම් වලින් ලබාගෙන තිබූ බැංකු අයිරා පහසුකම් සහ ආනයනික ණයවර ලිපි ණය පහසුකම් සඳහා බැංකුව අයකරන ලද පොලී හා ගාස්තු 2012 වර්ෂයේදී මධ්‍යම පරිපාලන වියදම් යටතේ පෙන්නුම් කොට ඇතත් 2013 වර්ෂයේදී එයට අදාල වටිනාකම් මසුන් අලෙවි වියදම් (ජංගම ගිණුම් 1257) සහ ටින්කල මසුන් අලෙවි වියදම්( ජංගම ගිණුම අංක 1846) යටතේ සඳහන් කිරීම හේතුවෙන් 2012 සහ 2013 වියදම් සැසඳීමේදී අසාමාන්‍ය වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

ශීතාගාර වියදම්වල වැඩිවීමට හේතුව ශීතාගාරය වෙනුවෙන් කල්බදු ණය පහසුකම් යටතේ මිලදීගෙන ඇති ෆෝක්ලිෆ්ට් රථයට අදාල කල්බදු පොලී වටිනාකම 2013 වර්ෂයේදී ගෙවීම හේතුවෙනි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්ය සාධනය

කාර්ය සාධකය යටතේ විගණන වාර්තාවේ සඳහන් විග්‍රහයට අනුව සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම්වල අලෙවි ප්‍රමාණ හා වටිනාකම්වල අඩුවීම සහ ශීතාගාර ආදායම අඩුවී වියදම් වැඩිවීමට බලපෑ කරුණු ඉහත අංක 3.1 හි මූල්‍ය ප්‍රතිඵල යටතේ ශුද්ධ අලාභය වැඩිවීමට හේතුවූ කරුණු ලෙස ඍජු ලෙස බලපා ඇත.

### 4.2. කාර්ය මණ්ඩල පරිපාලනය

රජයේ ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් කොන්ත්‍රාත් පදනමින් සිටි සේවකයින් ස්ථිර කිරීම තුලින් අනුමත කාර්ය මණ්ඩලයට වඩා අතිරික්ත සේවක පිරිසක් සිටින අතර ඉදිරියේදී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.

### 4.3. කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). සංස්ථාව ණය පදනම මත මසුන් අලෙවිකිරීම ප්‍රතිපත්තිමය තීරණමත සිදුනොකිරීමට තීරණයන් ගෙන නොමැත. සංස්ථාවේ අලෙවිසැල් භාර අලෙවි සහායකයින් වෙත ණය පදනම මත මසුන් සැපයීම සිදුකරනු ලබන අතර එම මසුන් අලෙවි කල පසු මුදල් සංස්ථාව වෙත ගෙවිය යුතුවේ. මෙම ක්‍රමවේදය සංස්ථාව ආරම්භය සිට පැවතඑන්නකි. ඇතැම් අවස්ථාවල ණය ගෙවීම් පැහැර ඇති අලෙවි සහායකයින් සම්බන්ධයෙන් ණය අයකරගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. එමෙන්ම ඒ පිළිබඳව මාසිකව රුස්වෙන විගණන හා කළමනාකරණ කමිටුව විසින් විමර්ෂණය කොට ගතයුතු නිර්දේශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කොට තීරණ ගෙන ක්‍රියාත්මක කොට ඇත.

(ආ). රජයේ රෝහල් වෙත මසුන් සැපයීම වෙනුවෙන් මුදල් අයකරගැනීම ඉතා පහත මට්ටමක පැවතීමට මූලික හේතුව මහා භාණ්ඩාගාරය වෙතින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත රජයේ රෝහල් වල සැපයුම් සඳහා ගෙවියයුතු මුදල් ලබාදීමේ ප්‍රමාදයයි. මහා භාණ්ඩාගාරය වෙත දැනුම් දී දැනට ලංකා ධීවර සංස්ථාවෙන් සිදුකරනු ලබන මසුන් සැපයුම් වෙනුවෙන් ප්‍රමාදයකින් තොරව මුදල් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස්කොට ක්‍රියාත්මකව පවතී .ඒ අනුව 2013-12-31 දිනට පැවති සම්පූර්ණ හිඟ මුදල් මේ වනවිට සංස්ථාව වෙත ලැබී ඇත.

(ඇ) සිංහපුර නිවාඩු නිකේතනයේ අයිතිය නීත්‍යානුකූලව ලබාගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

4.4. **<u>නිශ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්</u>**

අක්‍රිය තත්ත්වයෙන් පැවති බැංකු ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන වසා දමා ඇත.

4.5. **<u>ආර්ථික නොවන ගණුදෙනු</u>**

(අ) සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සිදුකරනුයේ බරපතල මූල්‍ය අර්බුදකාරී තත්ත්වයක් යටතේය. එහෙයින් විශ්‍රාම පාරිතෝෂිත ජල විදුලි දුරකථන වැනි ගෙවීම් කිරීමේදී ප්‍රමාදවීම් සිදුවීම නොවැලැක්වියහැක.

(ආ) මුදල් පනතේ නියමයන්ට අනුකූලව භාණ්ඩාගාර අනුමැතියට යටත්ව ලංකා බැංකුවෙන් ලබාගත් බැංකු අයිරා පහසුකම වෙනුවෙන් පොලී ගෙවීමට සිදුවුවත් එය චෙක්පත් අගරුවීම හේතුවෙන් සිදුවූවත් නොවේ.

4.6. **<u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>**

මතභේදයට තුඩුදෙන ගණුදෙනු යටතේ පෙන්නුම් කොට ඇති සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කොට ඇති වටිනාකම් අදාල වනුයේ සංස්ථාවේ මසුන් හා මත්ස්‍ය නිෂ්පාදනවලට අදාලව අලෙවි ප්‍රවර්ධන අරමුණු කොටගෙන සිදුකරන ලද ගෙවීම් වේ. එමෙන්ම රාජ්‍ය උත්සව වෙනුවෙන් රාජ්‍ය ආයතනයක් ලෙස සිදුකරනු ලබන කාර්යයන්ට අදාල ගෙවීම්ද මෙයට ඇතුලත් වේ.

4.7. **<u>අයවැය පාලනය</u>**

මුදල් පනතේ නියමයන්ට අනුකූලව ඉදිරි වර්ෂයට අදාල අයවැය ලේඛනය පිලියෙල කරනු ලබන අතර වර්ෂ ගණනාවක සිට සංස්ථාව මුහුණ පා ඇති මූල්‍ය අර්බුදය හා සම්පූර්ණ වියදම ආවරණය වන දායකත්වය ලබාගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන අපේක්ෂිත අලෙවි ඉලක්ක ලඟාකර ගැනීමට නොහැකි වී ඇත. මේ තත්වය යටතේ අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර විචල්‍යයන් වාර්තාවේ.

5. **<u>පද්ධති හා පාලනයන්</u>**

විගණන වාර්තාවෙන් පෙන්නුම් කොට ඇති පරිදි සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන පරික්ෂාවන් ප්‍රධාන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ඉටුකිරීමට පියවර ගෙන ඇත.

1. <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

1.1. <u>පොදු ප්‍රතිපත්ති</u>

1.1.1 <u>ගිණුම් පිළියෙල කිරීමේ පදනම</u>

ලංකා ධීවර සංස්ථාවේ 2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් කොට නොමැත..

ලංකා ධීවර සංස්ථාව විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නිකුත්කරන ලද නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් සුදුසු පරිදි සහ ක්‍රමානුකූලව 2012-01-01 දින සිට අනුගමනය කරමින් 2013 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

1.1.2.. <u>ගිණුම් ක්‍රමවේදය වෙනස්වීම</u>

2011-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි එදින දක්වා පැවැති විමධ්‍යගත ගිණුම් ක්‍රමවේදය වෙනුවට මධ්‍යගත ගිණුම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශවල ආකෘතීන්ද යලි සකස් කරන ලදි. 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉහත ක්‍රමවේදයට අනුව පිළියෙල කොට ඇත.

1.1.3. <u>සන්සන්දනාත්මක තොරතුරු</u>

පසුගිය වසරේ උපයෝගී කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූපී ලෙස සංස්ථාව විසින් මෙම වර්ෂයේද යොදාගෙන ඇත. අවශ්‍ය සෑම අවස්ථාවකදීම පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා පසුගිය වර්ෂයේ අගයන් සහ ඡේද නැවත සකස් කර ඇත.

1.1.4. <u>ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්</u>

සියළුම වැදගත් පූර්ව ශේෂ පත්‍ර සිදුවීම් සැලකිල්ලට භාජනය කර ඇති අතර උචිත අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශයන්හි සකස්කිරීම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

<u>1.15 බදුකරණය</u>

(අ) <u>බදු ගණනය කිරීම</u>

මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තාකර ඇති ආකාරයට ආදායම් බදු වෙන්කිරීම් මූලිකව ආදායම් සහ වියදම් මත රදා පවතින අතර 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

සමාලෝචිත වර්ෂයේ තුලදී සංස්ථාව විසින් පූර්ව වර්ෂයේ පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තු ගෙවීම සිදුකොට නොමැත.

(ආ) <u>ප්‍රමාද වූ බදු ගෙවීම</u>

සමුච්චිත බදු ගණනය කලහැකි අලාභයක් වාර්තාවන බැවින් මූල්‍ය ප්‍රකාශන වල සමාලෝචිත වර්ෂයේද ආදායම් බදු වෙනුවෙන් වෙන්කිරීමක් සිදුකොට නොමැත.

1.2. <u>වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම</u>

### 1.2.1. **දේපළ, පිරියත සහ උපකරණ**

දේපොල පිරියත හා උපකරණ පිරිවැය ගණනය කොට ඇත්තේ මිලදීගැණුම් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය හා එයට ආනුෂාංගික වියදම් ඇතුලත්වය. ප්‍රාග්ධන වියදම් ලෙෂ සලකනුයේ ව්‍යාපාරය පවත්වාගෙනයාම හා ව්‍යාපාරයේ ආදායම් උත්පාදන ධාරිතාවය වැඩිකිරීම දරනු ලබන්නාවූ වත්කම් අත්පත්කරගැනීම, වැඩි දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීමට අදාලව දරනු ලැබූ වියදම්ය.

දේපළ , පිරියත සහ උපකණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වෙන්කිරීම් වටිනාකම අඩුකරන ලද අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

### 1.2.2. **ක්ෂය වෙන්කිරීම / ක්‍රමක්ෂය**

ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ක්ෂයවෙන්කිරීම ගණනය කොට ඇත. ක්ෂය වෙන්කිරීමේ අනුපාතය ගණනය කොට ඇත්තේ ස්ථාවර වත්කම්වල උපයෝගී පිරිවැය පදනම් කොට ගෙනය.

සංස්ථාවේ ස්ථාවර වත්කම්වලට අදාල ක්ෂය කිරීම් අනුපාතයන් පහත දක්වා ඇත.

| | **ප්‍රයෝජනවත් ආයුකාලය (වර්ෂ)** | **ක්ෂය කිරීමේ අනුපාතය** |
|---|---|---|
| ඉඩම් | - | නැත |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 50 | 02% |
| පිරියත , යන්ත්‍රසූත්‍ර ලීබඩු අධිශීතකරණ සහ බරකිරීමේ තරාදි | 10 | 10% |
| මෝටර් වාහන | 05 | 20% |
| කාර්යාල උපකරණ හා වෙනත් | 12 | 8.5% |

ප්‍රදානයන් ලෙස ලැබී ඇති වත්කම් ක්ෂය කිරීමේ අනුපාතයන් පදනම් කොට ගෙන ක්‍රමක්ෂය කොට ඇත.

නව අලෙවිසැල් ඉදිකිරීම සදහා දරණ ලද වියදම් අදාල ගොඩනැගිලි, කුලී පදනම මත ලබාගත් කාලය පදනම් කොටගෙන එකී පිරිවැය වාර්ෂික ලාභයට එරෙහිව ලියාහැර ඇත. ඒ අනුව වර්ෂයේ වියදම් වලින් කපා හරින ලද අගය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයටද ඉතිරි වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේද පෙන්නුම් කොට ඇත

### 1.2.3. **වත්කම් අගය කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව ලංකා ධීවර සංස්ථාව සතු දැනට අඨත්වැඩියා තත්වයේ පවත්නා බහුදින ධීවර යාත්‍රා දෙක හැර අනෙකුත් සියළුම ස්ථාවර වත්කම් ආයුගණක තක්සේරුකරුවෙකු විසින් නැවත අගය කිරීම සිදුකරන ලදි. එකී තක්සේරු වාර්තාව පදනම් කොටගෙන පහත සදහන් පරිදි ප්‍රත්‍යාගණන සංචිත ගිණුම්ගත කරන ලදි.

| | | **රුශත** |
|---|---|---|
| තක්සේරුකරුගේ වාර්තාව අනුව ප්‍රත්‍යාගණිත ස්ථාවර වත්කම් වටිනාකම | - | 1,709,790,150 |
| අඩුකලා :- සිංහපුර නිවාඩු නිකේතනයේ ඇති වත්කම්වල | | |

| | | |
|---|---|---|
| වට්නාකම (මෙම වත්කම්වල අයිතිය සංස්ථාව වෙත පවරා නොමැත) | - | (1,229,000.00) |
| **2013-12-31** දිනට පෙර පැවති ස්ථාවර වත්කම් ලියාහැරි අගය | - | (420,392,948) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | 1,288,168,202 |
| | | ============ |

**ආයෝජන**

ලංකා ධීවර සංස්ථාව , සීමාසහිත යුනියන් ෆිෂ් ප්‍රොඩක්ට්ස් සමාගම සමග එක්ව බද්ධ ව්‍යාපාර ගිවිසුමකට එළඹ තිබුණි. සංස්ථාවේ ආයෝජනය ලෙස සංස්ථාව සතු ඉඩමක් ප්‍රත්‍යාගණනය කොට බද්ධ ව්‍යාපාරයට පවරා ඇත. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූ බැවින් සංස්ථාව මෙකී බද්ධ ව්‍යාපාර ගිවිසුම අවසන් කිරීමට සහ ඉඩම නැවත අත්පත්කර ගැනීමට පියවර ගෙන ඇත. මෙයට අදාල නීතිමය කටයුතු සිදුකෙරෙමින් පවතී.

**වෙළඳ තොග**

මසුන් කරවල, සහ අයිස් තොග යනාදී වෙළඳ තොග බරතබනලද සාමාන්‍ය පිරිවැය භාවිතා කරමින් අගය කර ඇත. වෙළඳ නොවන තොග එහි පිරිවැය මත තක්සේරු කර ඇත.

ප්‍රධාන කාර්යාලය යටතේ දක්වා ඇති තොග වටිනාකමෙහි ඩීසල් තොගය , ශීතාගාරයට අවශ්‍ය තෙල් තොග, ලිපිද්‍රව්‍ය , අමතර කොටස් සහ ප්‍රධාන කාර්යාලයට අයත් අංශවලට අවශ්‍ය වෙනත් ද්‍රව්‍ය තොග ඇතුලත්වේ. මෙයට අදාල ගැලපුම් සටහන් ගිණුම්වල අවශ්‍ය පරිදි සිදුකොට ඇත.

1.2.4 **වෙළඳ හා වෙනත් ලැබීම්**

වෙළඳ හා වෙනත් ලැබීම් විකුණුම් මිල හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙක මත සටහන් කොට ඇත. බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම පහත සඳහන් පරිදි සිදුකොට ඇත.

- අවු. **05** වැඩි කල් ඉකුත්වූ ණය - 100%
- අවු **01 -05** කල් ඉකුත්වූ ණය - 05%

1.2.5. **මුදල් හා ආසන්න මුදල්**

මුදල් හා ආසන්න මුදල් යන්න අත ඉතිරි මුදල් , ඉල්ලුම් තැන්පතු සහ මුදල් බවට පහසුවෙන් පත්කල හැකි සහ වටිනාකමෙහි වෙනස්වීමේ පැහැදිලි අවධානමකට යටත් කෙටිකාලීන ඉක්මන් ද්‍රවශීල ආයෝජන ලෙස අර්ථනිරූපනය කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කිරීමේදී මුදල් සහ ආසන්න මුදල් යන්නට අතැති මුදල් සහ බැංකුවේ තැන්පත් කර ඇතිමුදල් සහ බැංකු අයිරා අඩුකිරීමෙන් පසු ශුද්ධ තැන්පතුවලින් සමන්විත වේ.

ගෙවන ලද සහ ලැබුණු පොලිය මෙහෙයුම් මුදල් සංසරණය යටතේ වර්ග කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඍජු ක්‍රමවේදය මත වාර්තාකර ඇත.

1.3. **වගකීම් හා වෙන්කිරීම්**

**ප්‍රාග්ධන වියදම් හා අසම්භාව්‍ය වගකීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට ප්‍රාග්ධන වියදම් සම්බන්ධ බැඳීම් හා අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශ වල සටහන් ලෙස හෙළිදරව් කොට ඇත.

**අසම්භාව්‍ය වගකීම්**

සේවයෙන් ඉවත්වූ සේවකයින් පස් දෙනෙකු විසින් පවරා ඇති නඩු වෙනුවෙන් වූ වෙන්කිරීම් අසම්භාව්‍ය  වගකීම් යටතේ පෙන්නුම් කොට ඇත.

1.3.1 **විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19ට අනුව වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණක තක්සේරු කරුවකු විසින් ලංකා ධීවර සංස්ථාවේ 2013-12-31 දිනට සේවක පාරිතෝෂික වටිනාකම ගණනය කර ඇත.

(අ) පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම තීරණය කිරීම සඳහා පුරෝකතන ඒකක ණය (Projected Unit Credit-pvc) ක්‍රමවේදය අදාල කරගෙන ඇත.

(ආ) දිගුකාලීන වාර්ෂික වට්ටම් අනුපාතය 10% කි.

(ඇ) පාරිතෝෂික සූත්‍රය : වර්ෂ 05 ක සේවය සම්පූර්ණ කරන ලදුව සේවය කරන ලද එක් වර්ෂයකට මාස 1/2 ක වැටුප යන පදනම

(ඈ) විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මට අදාල සැලැස්මට අදාල 2013-12-31 දිනට අදාල වටිනාකමේ වට්ටම් අනුපාතය ගැලපුම් කරන ලද අගය රු. 62,205,170 කි

(ඉ) ශ්‍රී.ල.ගි.ප්‍ර.අංක 19 අනුව එක් වර්ෂයක සේවය සම්පූර්ණ කොට ඇති සියළුම සේවකයින් ආයුගණක පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම් ගණනය කිරීමට අදාල කරගෙන ඇත.

1.3.2 **සේවක ගෙවීම් දායකත්වය**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට අදාල සංස්ථාවේ දායකත්වය පිළිවෙලින් 15%  සහ 03% අනුරූපී වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස පෙන්නුම් කොට ඇත.

1.33. **ආදායම් ප්‍රකාශය**

ආදායම් ලෙස ගිණුම්ගත කොට ඇති වටිනාකමට අයකරනු ලබන බදු හා වට්ටම් අඩුකල අගයටය. සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට දරණ ලද වියදම්, දේපොල පිරියත හා උපකරණ වල කාර්යක්ෂමතාවය වැඩිකරගැනීම සඳහා දරණ ලද වියදම් ලාභලාභ ගණනය කිරීමේදී ආදායමට එරෙහිව ලියාහැර ඇත.

පිරිවැය පදනම මත සංස්ථාවේ කාර්යසාධනය වෙනුවෙන් වූ වියදම් සියල්ල ආදායම් ප්‍රකාශයට ඇතුලත් කොට ඇත. සංචිතවල වෙනස්වීම මූල්‍ය ප්‍රකාශන වල සටහන් ලෙස දක්වා ඇත. ස්ථාවර වත්කම් බැහැරකිරීමෙන් වාර්තාවූ ආදායම් ස්වරූපයේ ලාභ හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ඇතුලත් කොට ඇත.

සංස්ථාවේ ක්‍රියාකාරී මෙහෙයුම් වලට අදාල සියළු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ නියමිත ශීර්ෂයන් යටතේ වර්ගීකරණය කොට දක්වා ඇත.

සංචිත වල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ පෙන්නුම් කොට ඇත.

දේපළ, පිරියත සහ උපකරණ බැහැරකිරීම්වලට අදාල ආදායම් ස්වරූපයේ ලාභ සහ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කොට ඇත.

1.34. **<u>ලංකා බැංකු ණය පහසුකම්</u>**

රු.මිලියන **233** ක වටිනාකමැති බහාලුම් අයිස් යන්ත්‍රාගාර හයක් සුරැකුම් ලෙස තබා ලංකා බැංකුවේ ආයතනික ශාඛාවෙන් ලංකා ධීවර සංස්ථාවේ අලෙවිසැල් ජාලය පුළුල්කිරීම සඳහා රු.මිලියන 100ක ණය පහසුකම් ලබාගෙන ඇත.

1.3.5. **<u>අනෙකුත් හෙළිදරව්කිරීම්</u>**

ත්‍රිකුණාමලය තොග මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ මෙහෙයුම් හා මූල්‍ය කටයුතුවලට අදාල කළමනාකාරිත්ව පාලනය ලංකා ධීවර සංස්ථාව වෙත පවරා තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ ආදායම් හා වියදම් ලංකා ධීවර සංස්ථාවේ ගිණුම් පොත්වල ලැබීම් හා ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කොට ඇත.

කළමනාකාරී ගාස්තු හා ලාභ බෙදීම යන කරුණු පිළිබඳව අනුගමනය කළයුතු පදනම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැත.

## ලංකා ධීවර සංස්ථාව
## මූල්‍ය සාරාංශය

| | 2013 Rs.000 | 2012 Rs.000 | 2011 Rs.000 | 2010 Rs.000 | 2009 Rs.000 | 2008 Rs.000 | 2007 Rs.000 | 2006 Rs.000 | 2005 Rs.000 | 2004 Rs.000 | 2003 Rs.000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **<u>වෙළඳ ප්‍රතිඵල</u>** | | | | | | | | | | | |
| පිරිවැටුම් | 1,939,730 | 2041346 | **1,942,858** | **1,308,606** | **911,698** | **100,974** | **1,136,312** | **736,946** | **433,151** | **341,176** | **360,661** |
| මෙහෙයුම් ලාභය (අලාභය) | (109,966) | (95,781) | (89,512) | (78,279) | (134,108) | (96,103) | (32,789) | (74,334) | (122,426) | (98,200) | (86,940) |
| අතිවිශේෂ (සුනාමි ව්‍යසනය) | - | - | - | - | - | - | - | - | - | (10,218) | - |
| වෙනත් ආදායම් | 38,790 | 54108 | 20542 | 18,855 | 30,219 | 39,928 | 23,667 | 46,715 | 88,111 | 72,072 | 91,714 |
| මෙහෙයුම් නොවන ලාභ | 16,730 | - | - | - | - | - | - | - | - | - | - |
| ශුද්ධ ලාභ (අලාභය) | 54,446 | **(41,673)** | **(68,970)** | **(59,424)** | **(103,889)** | **(56,175)** | **(9,122)** | **(27,619)** | **(34,315)** | **(36,346)** | **4,774** |
| ශේෂ පත්‍රය | | | | | | | | | | | |
| යෙදවූ ප්‍රාග්ධනය | 1,041,173 | (194,657) | (84,882) | (18,488) | 33,168 | 141,253 | (573,235) | 213,528 | 310,271 | 304,908 | 419,361 |
| දීර්ඝ කාලීන ණය | 111,802 | 93,707 | 136,731 | 94,344 | 82,876 | 29,868 | | - | 50,680 | 51,175 | 36,495 |
| විශ්‍රාම පාරිතෝෂික | 62,205 | 82,652 | 74,889 | 65,276 | 70,624 | 68,770 | 66,144 | 55,514 | 6,872 | 6,872 | 7,026 |
| ප්‍රදාන | 369,840 | 450,355 | 545429 | 632,254 | 772,455 | 902,479 | 718,494 | 697,730 | | - | - |
| | **1,585,020** | **432,057** | **672,167** | **773,386** | **959,123** | **1,142,370** | **211,403** | **966,772** | **367,823** | **362,955** | **462,882** |
| **<u>වත්කම්</u>** | | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 1,710,015 | 498,529 | 587,566 | 696,438 | 833,070 | 978,297 | | 762,669 | 116,195 | 118,645 | 133,931 |
| ආයෝජන | 110,576 | 110,576 | 110,576 | 110,576 | 110,577 | 173,055 | 165,532 | 161,058 | 164,978 | 172,298 | 172,318 |
| ණය ලැබීම් සහ වෙනත් | 17,363 | 17,363 | 50,099 | 50,099 | 50,099 | 50,100 | 50,100 | 50,099 | 50,099 | 50,099 | 59,381 |
| ජංගම වත්කම් | 515,720 | 466,851 | 460,372 | 317,515 | 288,828 | 200,437 | 172,312 | 181,374 | 143,396 | 109,540 | 174,890 |
| ජංගම වගකීම් | (768,654) | (661,262) | (536,446) | (401,242) | (323,450) | (259,519) | (176,541) | (188,428) | (106,845) | (87,627) | (77,638) |
| | **1,585,020** | **432,057** | **672,167** | **773,386** | **959,124** | **1,142,370** | **211,403** | **966,772** | **367,823** | **362,955** | **462,882** |
| ජංගම අනුපාතය | 0.64:1 | 0.66:1 | 0.86:1 | 0.79:1 | 0.89:1 | 0.77:1 | 1:1.02 | .96:1 | 1.34:1 | 1.25:1 | 2.25:1 |
| ශුද්ධ ලාභ අනුපාතය | -2.81% | -2.01% | (3.49) | (3.12) | (11.75) | (5.72) | (0.80) | (3.75) | (7.92) | (10.65) | 1.32 |
| සේවා නියුක්ත සංඛ්‍යාව | 1275 | 1325 | 1315 | 1,038 | 652 | 718 | 763 | 720 | 678 | 658 | 697 |

## අනුපාත විශ්ලේෂණය

| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 488,531,057.00 | 434,550,735.93 | 460,371,620.06 | 317,514,504.86 | 288,828,759.38 |
| | 768,654,822.00 | 661,261,994.96 | 536,446,231.13 | 401,241,785.06 | 323,450,964.05 |
| | 0.64 :1 | 0.66 :1 | 0.86 :1 | 0.79 :1 | 0.89 :1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 405310021 x 100 | 331,140,489.47 | 351,107,455.10 | 241,266,058.17 | 248,657,006.92 |
| | 768654822 | 661,261,994.96 | 536,446,231.13 | 401,241,785.06 | 323,450,964.05 |
| | 0.53 : 1 | 0.50 :1 | 0.65 :1 | 0.60 :1 | 0.77 :1 |
| | (75,841,048.00) | (41,763,563) x 100 | (68,969,869) x 100 | (59,423,907.55) x100 | (103,889,474.95) x100 |
| | 1,969,485,805.00 | 2,078,840,744 | 1,977,444,527 | 1,904,765,517.35 | 884,523,559.30 |
| ශුද්ධ ලාභ අනුපාතය % | (3.85) % | (2.01) % | (3.49) % | (3.12) % | (11.75) % |

# අපේ මානව සම්පත්

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|
| සමස්ථ සේවක සංඛ්‍යාව | 611 | 725 | 763 | 718 | 652 | 1038 | 1315 | 1325 | 1275 |
| විධායක නිලධාරීන් (පුහුණුවන්නන්ද ඇතුළු | 65 | 66 | 66 | 58 | 49 | 58 | 80 | 78 | 76 |
| ලිපිකරු හා කාර්මික | 326 | 318 | 301 | 290 | 289 | 210 | 756 | 751 | 733 |
| සුළු සේවකයින් | 220 | 341 | 396 | 370 | 314 | 770 | 479 | 496 | 466 |